වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சு

MINISTRY OF PLANTATION INDUSTRIES



වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

Annual Report

2015

තේ ශක්ති අරමුදල

தேயிலை சக்தி நிதியம்

TEA SHAKTHI FUND



තේ ශක්ති අරමුදල

"ඉර සේවය මෙන් සෑමදා සේවයට"

වාර්ෂික වාර්තාව - 2015

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

පටුන

හැඳින්වීම	02-03
දැක්ම, මෙහෙවර, පරමාර්ථ	04
ලේකම්තුමාගේ පණිවිඩය	05-06
මල්‍ය විශ්ලේෂණය	07
සංස්ථාපිත තොරතුරු	08
කළමනාකරණ මණ්ඩලය	09
ජ්‍යෂ්ඨ කාර්ය මණ්ඩලය	10
අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව	11
ආයතනයේ ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශය	12-15
තේ ශක්ති ව්‍යාපෘති	16
මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය	17-28
ආදායම් විස්තරය	29
ශේෂ පත්‍රය	30
ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය	31
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	32
ගිණුම්කරණ ප්‍රතිපත්ති	33-43
ගිණුම්කරණ සටහන්	44-49
විගණකාධිපති වාර්තාව	

හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් පනවන ලද 2000 අංක 47 දරන තේ ශක්ති අරමුදල පනත යටතේ 2000 අගොස්තු මස 18 වන දින තේ ශක්ති අරමුදල ස්ථාපිත කරන ලදී. තේ ශක්ති අරමුදල සංස්ථාපිත වාණිජ ව්‍යවසායන් ලෙසට ක්‍රියාත්මක අතර, එයට ආරම්භක රාජ්‍ය මූල්‍ය දායකත්වය ලෙසට රු. 437,505,030.22 හා කොටස් ප්‍රාග්ධනය ලෙස රු. 208,959,130.00 ක මුදලක් ආයෝජනය කර ඇත.

ප්‍රධාන කාර්යාලය කඩුවෙල ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ තලවතුගොඩ, මාදිවෙල පාරේ අංක 553/A දරණ ස්ථානයේ පිහිටා ඇත.

තේ ශක්ති අරමුදලේ ප්‍රධාන අරමුණු

- කුඩා තේ වතු හිමියන්ගේ ආර්ථික හා සමාජ තත්ත්වය නඟා සිටුවීම සඳහා ඉතිරි කිරීම් සහ ප්‍රාග්ධන කටයුතුවලට යොමු කිරීම
- තේ කර්මාන්තයට අදාළ ආයෝජන ප්‍රවර්ධනය කිරීම
- කුඩා තේ වතු හිමියන්ගේ දළු නිෂ්පාදන ක්‍රියාවලියට අවශ්‍ය පහසුකම් හා අලෙවි ප්‍රවර්ධන පහසුකම් සැපයීම
- කුඩා තේ වතු හිමියන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තේ ශක්ති අරමුදල විසින් ව්‍යාපෘති 04ක් ක්‍රියාවට නංවා ඇත.

1. **තේ ශක්ති අරමුදලේ කම්හල් ව්‍යාපෘති ජාලය**

   මෙම ව්‍යාපෘතියට අයත් ක්‍රියාත්මක කම්හල් 10ක් කළුතර, ගාල්ල, මාතර, කෑගල්ල, නුවරඑළිය, රත්නපුර සහ බදුල්ල යන දිස්ත්‍රික්කවල පිහිටා ඇති අතර, එම කම්හල්වලට දළු සපයන දළු හිමියන් 4000කට ආසන්න ප්‍රමාණයකින් සමන්විතය.

2. **තේ ශක්ති පොහොර ව්‍යාපෘතිය**

   කළුතර දිස්ත්‍රික්කයේ හොරණ අරමණාගොල්ලේ ස්ථානගත කර ඇති පොහොර නිෂ්පාදන සංකීර්ණයේ නිෂ්පාදිත පොහොර තේ ශක්ති සමිති පොහොර නමින් එළි දැක්වේ. ප්‍රධාන වශයෙන් තේ, රබර්, පොල් වගාවන් සඳහා අවශ්‍ය ගුණාත්මක හා තත්ත්වයෙන් උසස් පොහොර නිෂ්පාදය කරනු ලබයි. තේ ශක්ති කම්හල් පාදක කරගනිමින් පොහොර බෙදා හැරීම සිදු කරනු ලබන අතර, සෘජු අලෙවි නියෝජිතයින් ද මෙයට ඇතුළත් වේ. සමස්ත වෙළෙඳපොළෙන් 2% ප්‍රතිශතයක් ආසන්න වශයෙන් අත්පත් කරගෙන ඇත.

3. තේ ශක්ති දේශීය තේ අලෙවි ව්‍යාපෘතිය

තත්ත්වයෙන් උසස් නැවුම් නිමි තේ ලාභදායී ලෙස පාරිභෝගිකයන් සහ රාජ්‍ය, රාජ්‍ය නොවන ආයතනයන්ට ලබා දීම මෙමඟින් සිදු කෙරේ. කුඩා තේ වතු හිමියන්ගෙන් දළු ලබා ගෙන තේ ශක්ති කම්හල් මඟින් නිෂ්පාදනය වන නිමි තේ ඇසුරුම් සඳහා භාවිතා කරනු ඇත. කීර්තිමත්භාවයක් සහ සාපේක්ෂව සැලකිය යුතු වෙළෙඳපොළක් මෙම ව්‍යාපෘතිය මඟින් අත්පත් කර ගෙන ඇති අතර, අඛණ්ඩ සැපයීම් සිදු කරනු ඇත.

4. සුභ සාධන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය මඟින් සමාජ හා සුභසාධන ආරක්ෂිත ක්‍රමය යටතේ ප්‍රතිලාභ ගෙවීම් සිදු කරනු ලැබේ. එමඟින් ස්වභාවික මරණ, හදිසි අනතුරු, වැඩිහිටි මරණ, සැත්කම්, අකර්මන්‍යවීම්, අංශභාග, හදිසි අනතුරු ප්‍රතිලාභ ගෙවීම් ආවරණය කරනු ලබයි.

දැක්ම

කුඩා තේ වතු හිමියන්ගේ ආර්ථික හා සමාජ පැවැත්මේ
අභිවෘද්ධියට කැපවූ විශිෂ්ඨම ආයතනය බවට පත්වීම

මෙහෙවර

තේ ශක්ති අරමුදලේ සාමාජිකයන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා කාර්යක්ෂමව හා සඵලදායීව තේ ශක්ති අරමුදල කළමනාකරණය කිරීම.

තේ ශක්ති අරමුදලේ පරමාර්ථ

- කුඩා තේ වතු හිමියන්ගේ සිත් තුළ ඉතිරි කිරීමේ පුරුද්ද ධාරණය කරවීම හා ඔවුන්ගේ ආර්ථික හා සමාජීය තත්තවය උසස් කරලීම.
- තේ කර්මාන්තයට අදාළව අවශ්‍යවන්නා වූ ආයෝජන ප්‍රවර්ධනය කිරීම.
- කුඩා තේ වතු හිමියන්ගේ තේ නිෂ්පාදනය සඳහා ඇවැසි තේ කර්මාන්තශාලා අත්පත් කර ගැනීම හා වැඩි දියුණු කිරීම හා ඒ සඳහා ඇවැසි අනෙකුත් පහසුකම් සපයාදීම .
- එම තේ කර්මාන්තශාලාවල නිෂ්පාදනයන් අලෙවි කිරීමේ කාර්යයන් වැඩි දියුණු කර සංවර්ධනය කිරීම.
- කුඩා තේ වතු හිමියන් වශයෙන් තේ නිෂ්පාදන කටයුතුවල නියැලී සිටින අයගේ සුභ සාධනය සඳහා අවශ්‍යවන්නා වූ කටයුතු සිදු කිරීම.
- වැවිලි කර්මාන්තය සඳහා අවශ්‍ය වන පොහොර ආනයනය කිරීම, නිෂ්පාදනය හා අලෙවි කිරීම.
- ශක්ති සම්පන්න ස්වයං මූල්‍ය සංවිධානයක් ලෙස පවත්වා ගෙන යාම.
- සාධ්‍ය වූ ලාභ උපදවන ස්ථිතියක් බවට පත් වීම සහ **10%** ක ශුද්ධ ලාභ ප්‍රමාණයක් පවත්වා ගැනීම.
- **25%** තිරසාර වර්ධනයක් අත් කර ගැනීම.
- අවදානම් හඳුනා ගැනීම සහ විධිමත් ලෙස කළමනාකරණය.

ලේකම්තුමාගේ පණිවිඩය

තේ ශක්ති අරමුදල 2000 අංක 47 තේ ශක්ති අරමදල් පනත යටතේ පිහිටුවන ලදී. ඉන් පසු 2016 වර්ෂයේදී ඇති වූ උග්‍ර කාරක ප්‍රාග්ධන අර්බුදය හේතුවෙන් ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් 2016.06.21 දිනැතිව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට ලද අංක අමප/16/1224/726/015-1 අංක හා 2016.07.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව තේ ශක්ති අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩල බලතල අත්හිටුවා එහි බලතල වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත පවරන ලදී. අංක 2289/43 හා 2022.07.22 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් තේ ශක්ති අරමුදල වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විෂය පථය යටතට පවරා ඇති අතර, අරමුදලේ කාර්යයන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබයි.

තේ ශක්ති අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු එහි කාර්යයන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් ඉටු කරනු ලබන අතර, ඒ සඳහා තේ ශක්ති අරමුදලේ සේවය කළ සීමිත කාර්ය මණ්ඩලයක් මෙම අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ඇත.

තේ ශක්ති අරමුදල යටතේ පැවති කර්මාන්තශාලා 12ක් ද මාවරල වත්ත සහ හොරණ අරමනාගොල්ලේ පිහිටි පොහොර ගබඩා සංකීර්ණය බදු පදනම මත හෝ කළමනාකරණය පැවරීමේ පදනම මත බාහිර පාර්ශවයන් වෙත පැවරීමට කටයුතු කරන ලදී. ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු කම්හල්වලින් බදු වාරික මුදල් සහ කළමනාකරණ ගාස්තු තේ ශක්ත අරමුදල වෙත ලැබෙන අතර, ඉදිරියේදී කෙටි කාලීන වගකීම් සහ රුපියල් මිලියන 135 ක සුභසාධන රක්ෂණ අරමුදල ගොඩනැගීමෙන් පසු ඉතිරි මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇත.

තේ ශක්ති අරමුදල 2015 වර්ෂයේදී පහත කාර්යයන් ඉටු කර ඇත.

- කර්මාන්තශාලා 09ක් සඳහා කුඩා තේ වතු හිමියන්ගෙන් ලබා ගත් අමු තේ දළු මෙට්‍රික් ටොන් 8.40 කින් නිමි තේ කිලෝ ග්‍රෑම් මිලියන 1.7ක් නිෂ්පාදනය කර ඇත.
- ප්‍රවර්තන වර්ෂයේදී ඇති වූ මූල්‍ය හිඟතාවය මත ණයවර ලිපි මඟින් පොහොර මිලදී ගැනීම් සිදු නොකරන ලද අතර, අවශ්‍ය මූලික පොහොර ලංකා පොහොර සමාගමෙන් මිලදී ගැනීම සිදු කරන ලදී.
- 2014 වර්ෂය සමඟ සැසඳීමේදී 2015 වර්ෂයේ දේශීය තේ අලෙවි අංශයේ ආදායම ඉහළ ගොස් ඇති අතර, එය රු. මිලියන 1.06 කි.
- 2015 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් කාරක ප්‍රාග්ධනය ලෙස රු. මිලියන 25ක මුදලක් ලැබුණ අතර, එය ආදායමක් ලෙස සලකා ඇති බැවින්, පසුගිය වසරට සාපේක්ෂව අලාභයේ අඩුවක් පෙන්නුම් කරයි.
- කුඩා තේ වතු හිමියන්ගේ සමාජ සුභසාධනය උදෙසා ක්‍රියාත්මක වන තේ ශක්ති සුභසාධන රක්ෂණ ක්‍රමවේදය මඟින් කුඩා තේ වතු හිමියන් 537 දෙනෙකු සඳහා රු. මිලියන 16.17 ක ප්‍රතිලාභ ලබා දී ඇත.

විධිමත් වතු අංශය අභිබවා සීඝ්‍රයෙන් තේ ක්ෂේත්‍රයෙහි සිය අනන්‍යතාවය තහවුරු කර ගත් කුඩා තේ වතු හිමියන් රටේ දරිද්‍රතාවය අඩු කිරීමට හා ජාතික ආර්ථිකයට දක්වා ඇති දායකත්වය වටහා ගැනීමෙන් ඔවුන් සංවිධානත්මක තලයකට ගෙන ඒම අරමුණු කර ගත් තේ ශක්ති අරමුදල් සංකල්පය කොතරම් කාලීන හා අර්ථසම්පන්න වැඩ පිළිවෙලක් ද යන්න තහවුරු වේ. එසේවුවද කළමනාකාරීත්වයෙහි පැවති අඩුපාඩු නිසා අපේක්ෂිත අරමුණු කරා ළඟානොවූ බව කණගාටුවෙන් වුවද සිහිපත් කළ යුතුව ඇත.

බී. එල්. ඒ. ජේ. ධර්මකීර්ති

ලේකම්

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

2015 දෙසැම්බර් 31 දින දක්වා වසර තුනක මූල්‍ය කාර්ය සාධනයේ සාරාංශ

	2013	2014	2015
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
ආදායම	773.03	621.59	573.52
විකුණුම් පිරිවැය	(702.63)	(611.32)	(552.52)
දළ ලාභය	70.39	10.27	21.00
වෙනත් ආදායම්	44.69	44.08	43.84
විකිණීමේ හා බෙදා හැරීමේ වියදම්	(17.87)	(15.51)	(14.93)
ආයතන හා පරිපාලන වියදම්	(195.66)	(200.33)	(188.38)
රාජ්‍ය පරිත්‍යාග කපා හැරීම්	43.75	43.75	119.30
ශුද්ධ මූල්‍ය වියදම්	(4.67)	(10.08)	(20.07)
ශුද්ධ ලාභය / අලාභය	(59.36)	(127.82)	(39.23)
ලාභාංශ	නැත	නැත	නැත
මුළු වත්කම්	882.45	58.47	696.79
කාරක ප්‍රාග්ධනය	119.00	63.39	6.85
ජංගම අනුපාතය	1:1.38	1:1.19	1:0.98

2014 සහ 2015 ශේෂයන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ පමිණීන් පරිදි ගැලපීම් කිරීමෙන් පසු ඉදිරිපත් කර ඇත.

සංස්ථාපිත තොරතුරු

නම : තේ ශක්ති අරමුදල

ලිපිනය : අංක 553A, මාදිවෙල පාරල තලවතුගොඩ.

දු .ක : 011-7421121

ෆැක්ස් : 0112796537, 0117421122

විද්‍යුත් ලිපිනය : tsf @teashakthi.gov.lk

සංස්ථාපනය කිරීමේ පනත : 2000 අංක 47 දරන තේ ශක්ති අරමුදල් පනත

සංස්ථාපනය කිරීමේ වර්ෂය : 2000

ව්‍යාපාර ස්වභාවය

* තේ කොමසාරිස් රෙගුලාසි යටතේ තේ දළු මිලදී ගැනීමේ පදනම මත කුඩා තේ වතු හිමියන්ගෙන් අමු තේ දළු මිලදී ගෙන නිෂ්පාදනය කිරීමේ සහ නීත්‍යානුකූලව බලයලත් මාර්ගයන් ඔස්සේ තේ විකිණීම.
* තේ වගාකරුවන්ට විශේෂයෙන් කුඩා තේ වතු හිමියන්ට ඉතා සුළු ලාභයක් තබාගෙන නිර්දේශිත සූත්‍රයක් අනුව පොහොර ද්‍රව්‍ය මිශ්‍ර කර විකිණීම.
* පාරිභෝගිකයින් වෙනුවෙන් දේශීය වෙළඳපොලේ තේ මිශ්‍රණයන් බෙදා හැරීම.

විගණකවරු : රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව

බැංකුකරුවන් : ලංකා බැංකුව

අධ්‍යක්ෂ මණ්ඩලය, විගණන සහ කළමනාකරණ කමිටු සාමාජිකයින් සහ විධායක කාර්යය මණ්ඩලය

- නොඑල් පද්මසිරි කාරියවසම් මහතා - සභාපති, කඩා තේ වතු සං. අධිකාරිය/තෙ ශක්ති අරමුදල (2015 ජනවාරී 01 සිට පෙබරවාරි 12 වන දින දක්වා)
- යූ.කේ.එස්. මිහිදුකුලසූරිය මහතා - අතිරේක ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය/සභාපති කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
- දීප්ති අබේවික්‍රම මහතා - අධ්‍යක්ෂ/සභාපති කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය (අප්‍රේල් 30 සිට අගෝස්තු 10 වන දින දක්වා)
- දේශබන්දු විජේරත්න දෙවගෙදර මහතා උසභාපති, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, (2015 දෙසැම්බර් 22 සිට ඉදිරියට)
- ඩබ්. එම්.එම්.බී.එච්. ගුණරත්න මහතා - ප්‍රධාන ගණකාධිකාරී/භාණ්ඩාගාර අධ්‍යක්ෂ (2015 මාර්තු 17 සිට 2015 අගෝස්තු 10 දක්වා)
- ඩී. පී. විමලසේන මහතා - ප්‍රධාන ගණකාධිකාරී/භාණ්ඩාගාර අධ්‍යක්ෂ (2015 දෙසැම්බර් 22 සිට ඉදිරියට)
- එස්. ආර්. එස්. ද සිල්වා මහතා - සාමාන්‍යාධිකාරී, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
- ඒ. ඩබ්. එච්. අයි. සී. වීරකෝන් මහතා - අතිරේක ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය (2015 දෙසැම්බර් 22 සිට ඉදිරියට)
- ඒ. එම්. පී. බී. අතපත්තු මහතා - අධ්‍යක්ෂ, මුදල් හා ක්‍රමසම්පාදන, මහාභාණ්ඩාගාරය (2014 ජනවාරී 22 සිට 2014 ඔක්තෝබර් 15 දක්වා)
- එම්. බී. සිරිල් මහතා - අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
- නෙවිල් රත්නායක මහතා - අධ්‍යක්ෂ, සමස්ත ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සංවිධානය/ප්‍රධාන විධායක නිලධාරී, තේ ශක්ති අරමුදල
- ඩබ්. ආර්. එස්. කරුණාරත්න මහතා - අධ්‍යක්ෂ/සභාපති, නුවරඑළිය කුඩා තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය
- ආර්. එම්. ගුණසේකර මහතා - අධ්‍යක්ෂ/සභාපති, ඌව කුඩා තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය
- ජේ. එම්. බී. ජේ. බණ්ඩාර මහතා - අධ්‍යක්ෂ/සභාපති, රත්නපුර ඌව කුඩා තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය
- කේ. එල්. ගුණරත්න මහතා - අධ්‍යක්ෂ/සභාපති, කළුතර කුඩා තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය
- එච්. සුසන්ත ද සිල්වා මහතා - අධ්‍යක්ෂ/සභාපති, ගාල්ල කුඩා තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය
- පී. ආර්. ඒ. රත්නායක මහතා - අධ්‍යක්ෂ/සභාපති, කෑගල්ල කුඩා තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය
- බී. පී. අබේසිංහ මහතා - අධ්‍යක්ෂ/සභාපති, මහනුවර කුඩා තේ වතු ප්‍රාදේශීය සමිති සංවිධානය

ජ්‍යෂ්ඨ කාර්ය මණ්ඩලය

01. ජේ. එම්. ඩි. පී. බී. අවිරුප්පොල මහතා	-	ප්‍රධාන විධායක නිලධාරී
02. නෙවිල් රත්නායක මහතා	-	ප්‍රධාන විධායක නිලධාරී (වැ. බ.)
03. පී. ජී. ආර්. තිස්ස මහතා	-	ප්‍රධාන ගණකාධිකාරී
04. එම්. එන්. එස්. මොහොට්ටි මහතා	-	අභ්‍යන්තර විගණක
05. ආර්. යූ. පී. ආර්. සිරිවර්ධන මහතා	-	කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන)
06. ඩබ්. එම්. ඩි. නිහාල් වීරසේකර මහතා	-	කළමනාකරු (පොහොර)
07. අරුණ ජයසුන්දර මහතා	-	ගණකාධිකාරී
08. එම්. ඒ. ඉන්දිකරත්න මහතා	-	කළමනාකරු (සුභසාධන)
09. ආර්. ගොඩකන්දආරච්චි මහතා	-	කළමනාකරු කම්හල්
10. ආනන්ද ධනසිරි මහතා	-	කළමනාකරු කම්හල්
11. පී.එච්.ආර්.පී. කරුණාරත්න මහතා	-	කළමනාකරු කම්හල්
12. ඒ. ජේ. ආර්. සෙනවිරත්න මහතා	-	කළමනාකරු කම්හල්
13. යූ. පී. එන්. මනෝජ් කුමාර් මහතා	-	කළමනාකරු කම්හල්

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

2015 දෙසැම්බර් 31 දිනට අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා තේ ශක්ති අරමුදලෙහි කාර්ය සාධනය පිළිබඳ වාර්තා කිරීමට ලැබීම ඉමහත් සතුටකි. ඉහළ යන කම්කරු වේතන සහ ඊට බැඳුනු අනෙකුත් වියදම් මධ්‍යයේ වුවද පසුගිය වර්ෂය පිළිබඳව සැලකිල්ල යොමු කරන විට තේ ශක්ති අරමුදල පාඩුව අඩු කරගැනීමේ ප්‍රවනතාවයකට යොමු වෙමින් සැලකිය යුතු සාධාරණ මට්ටමක දියුණුවක් සාක්ෂාත් කරගෙන ඇත.

පධාන ක්‍රියාකාරකම්

තේ ශක්ති අරමුදලෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් සංස්ථාපිත තොරතුරු යටතේ විග්‍රහ කොට ඇත. මෙම වර්ෂය තුළදී ප්‍රධාන ක්‍රියාකාරීත්වයේ වෙනසක් ලෙස යටිතුවර හා හිනදුම තේ ශක්ති කම්හල් සී/ස කළුබෝවිටියාන කර්මාන්තශාලා තේ සමාගමට දිගුකාලීන බදු ගිවිසුමක් මත පූර්ණ බදු දීමක් සිදුවූ අතර, ඒ හැර සැලකිය යුතු වෙනත් වෙනස්වීම් කිසිවක් නොතිබිණ.

මෙහෙයුම්වලින් ලද ආදායම්

මූල්‍ය වර්ෂය තුළදී තේ ශක්ති අරමුදලේ මෙහෙයුම්වලින් ලද ආදායම් සහ එකී මෙහෙයුම්වල ප්‍රතිඵල පිළිබඳව පිටු අංක 29 සිට 31 දක්වා දිවෙන අවසාන ගිණුම් වාර්තාවෙහි වෙන වෙනම අන්තර්ගත කර දක්වා ඇත.

අනාගත සංවර්ධන

ක්‍රියාකාරී මට්ටමේ පවතින කම්හල් 08 සඳහා

- කම්හල් උපදේශක කමිටු පත් කිරීම
- තේ තැරැව්කරුවන් හරහා නිමි තේවලට වැඩි මිලක් ලබා ගැනීම
- පරණ තත්ත්වයේ පවතින යන්ත්‍රසූත්‍ර නවීකරණය කර ඒවාට පිළියම් යෙදීම
- තේ ශක්ති කර්මාන්තශාලා තේ ශක්ති සමිතිවලට බදු දීමෙන් අලාභය අවම කර ගැනීමට බලාපොරොත්තු වීම හා දේශීය තේ අලෙවි අංශය මඟින් ඉතා උසස් ගුණාත්මක තේ නිෂ්පාදනය කරීම තුළින් දේශීය වෙළඳපොළ තුළ ස්ථාවරත්වයක් ඇති කර ගැනීම.
- සසිටිවී කැමරා පද්ධති සවිකර ජාලගත කිරීම

ආයතනයේ ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශය

ප්‍රධාන ක්‍රියාකාරකම්

තේ ශක්ති අරමුදලේ ප්‍රධාන ක්‍රියාකාරකම් මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය තුළන් විග්‍රහ කොට ඇත.

මෙහෙයුම්වලින් ලද ආදායම්

මූල්‍ය වර්ෂය තුළදී තේ ශක්ති අරමුදලේ මෙහෙයුම්වලින් ලද අලාභය අවසාන ගිණුම් වාර්තාවේ වෙන වෙනම පෙන්නුම් කර ඇත.

අනාගත සංවර්ධනය

කම්හල් නවීකරණය කිරීම සඳහා රු. මිලියන 50 කාරක ප්‍රාග්ධනය ලෙස යෙදවීමටත් රු. මිලියන 150ක මුදල නවීන යන්ත්‍ර මිලදී ගැනීමටත් රු. මිලියන 200 ක මදලක් මහාභාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කරන ලද. එහෙත් රු. මිලියන 25 ක මුදලක් පමණක් ලබා දුන් අතර, එම මුදල කාරක ප්‍රාග්ධනයක් ලෙස භාවිතා කරන ලදී.

කම්හල් සංවර්ධනය සඳහා

- උපදේශක කමිටු පිහිටු වීම.
- නිමි තේ තරඟකාරීව ඉහළ මිලකට අලෙවි කිරීම.
- යන්ත්‍ර සූත්‍ර නවීකරණය කිරීම.
- අලාභය අවම කිරීම සඳහා තේ කම්හල්, සමිති හා රජයේ ආයතන වෙත බදු දීම.
- කම්හල් මට්ටමින් පොහොර අලෙවි කිරීම.
- ගුණාත්මක තේ පාරිභෝගිකයන් වෙත බෙදා දීම.

ලාභ හා විසර්ජනයන්

විකුණුම් හා මෙහෙයුම් ප්‍රතිලාභවල 2015 **වර්ෂයට අදාළ විස්තර පහත පරිදි වේ.**

	2015 (රුපියල්)	**2014** (රුපියල්)
තැරැව්කාර විකුණුම්වලින් ලද ආදායම	525,348,607.00	556,475,091.00
දේශීය තේ විකුණුම්	28,146,840.00	28,607,143.00
පොහොර විකුණුම්	14,872,520.00	31,277,680.00
අමද්‍රව්‍ය ආදායම	2,357.00	326,302.00
කසල තේ ආදායම	5,426,424.00	5,626,443.00
විකුණුම් වට්ටම	(277,485.00)	(722,985.00)
මුළු ආදායම	**573,519,262.00**	**621,589,674.00**
විකුණුම් පිරිවැය	(552,517,570.00)	(611,323,143.00)
දළ ලාභය	**21,001,692.00**	**10,266,531.00**
වෙනත් ආදායම්	43,844,841.00	44,085,060.00
පරිපාලන වියදම්	(188,377,711.00)	(200,329,899.00)
විකුණුම් සහ බෙදා හැරීමේ වියදම්	(14,928,507.00)	(15,508,944.00)
මුළු මෙහෙයුම් ලාභය	(138,459,686.00)	(161,487,253.00)
මූල්‍ය පිරිවැය	(20,073,109.00)	(10,086,984.00)
බදුවලට පෙර මෙහෙයුම් ලාභය	**(39,232,292.00)**	**(127,823,734.00)**
ආදායම් බදු	-	-
ශුද්ධ ලාභය ඍ අලාභය	**(39,232,292.00)**	**(127,823,734.00)**

ලාභාංශ හා සංචිත

සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ලාභාංශයක් වාර්තා වී නොමැත.

සංස්ථාපිත ආධාර

2015 වර්ෂයේදී සංස්ථාපත ආධාර කිසිවක් වාර්තා වී නොමැත.

ප්‍රාග්ධන වියදම්

තේ ශක්ති අරමුදලේ යන්ත්‍ර සහ උපකරණ පිළිබඳ විස්තර වාර්ෂික ගිණුම් වාර්තාවල පිටු අංක 34 මඟින් දක්වා ඇත.

ජංගම නොවන දේපලවල වෙළඳ පොළ වටිනාකම

2015 දෙසැම්බර් 31 වන දිනට තේ ශක්ති අරමුදල සතු අස්පෘෂ්‍ය ජංගම නොවන වත්කමක් නොපවතී.

දායකත්ව ප්‍රාග්ධනය

රජයේ දීමනා	රු. 437,505,030.22
කොටස් ප්‍රාග්ධනය	රු. 208,959,130.00

බදු ගිවිසුම්

තේ ශක්ති අරමුදලට අයත් හිනදුම තේ කම්හල, සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමට වසරේ ලාභයෙන් 25% ක් අරමුදල වෙත ලබා දීමේ පදනමින් බදු දී ඇත. ගිලීමලේ තේ කම්හල, හිඳුරංගල කුඩා තේ වතු සංවර්ධන සමිතිය වෙත ලබා දුන් නමුත් 2015.01.01 දින එම ගිවිසුම අවලංගු කර නැවත පවරා ගන්නා ලදී.

යටිනුවර සහ හිනිදුම කම්හල් සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමට පවරා තේ ශක්ති අරමුදල වෙත රුපියල් මිලියන 50ක් ලබා ගන්නා ලදී.

අදාල නීති හා රෙගුලාසි සම්බන්ධයෙන් අනුකූලතාව

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී තේ ශක්ති අරමුදලෙහි නීති හා රෙගුලාසි උල්ලංඝණය කරනු ලබන කිසිඳු ක්‍රියාකාරකමක් සිදුව නොමැති බව සඳහන් කළ හැක.

අධ්‍යක්ෂක මණ්ඩලය

තේ ශක්ති අරමුදලෙහි අධ්‍යක්ෂ මණ්ඩලය පිටු අංක 09 හි දක්වා ඇත.

කොන්ත්‍රාත් සහ යෝජිත කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්බන්ධතාව

2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා තේ ශක්ති අරමුදල සමඟ ඇති කරගත් හෝ යෝජිත වූ කොන්ත්‍රාත් සම්බන්ධයෙන් කිසඳු අධ්‍යක්ෂවරයෙකු සෘජු හෝ වක්‍ර වශයෙන් සම්බන්ධතාවක් දක්වා නැත.

අධ්‍යක්ෂවරු විසින් ඔවුන් වෙත යම් සබඳතාවක් හෝ විශේෂයක් සහිත කරුණු සම්බන්ධයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට සිදු වන අවස්ථාවන්හීදී එකී කටයුත්තට පෙර තම සබඳතාව හෝ විශේෂත්වය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනෙකුත් අධ්‍යක්ෂවරු වෙත දැන්වීමට සහ ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටීමට අදාළ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වය වග බලා ගනී.

පරිසර ආරක්ෂාව

තේ ශක්ති අරමුදලෙ ප්‍රතිපත්තිය වනුයේ පරිසරයට වන හානි අවම මට්ටමකින් තබා ගනිමින් අදාල රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීම වන අතර, තේ ශක්ති අරමුදලේ සියළු ව්‍යාපාරික කටයුතු පරිසරයට වන බලපෑම අවම මට්ටමකින් පවත්වා ගනිමින් සිදු කිරීමට කටයුතු කර ඇත.

අඛණ්ඩ පැවැත්මේ සංකල්පය

තේ ශක්ති අරමුදල දැකිය හැකි අනාගතයක් දක්වා පවතී යන උපකල්පනය මත මූල්‍ය වාර්තා පිළියෙල කර ඇති අතර, මෙම සංකල්පය යොදා ගනිමින් වත්කම් සහ වගකීම් ජංගම හා ජංගම නොවන ලෙස වර්ග කරමින් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර ඇත.

සියලු පාර්ශවකරුවන්ට සියලු ප්‍රකාශ සඳහා සර්ව සාධාරණව සැළකීම

අපගේ පාර්ශවකරුවන්ගේ අනුග්‍රහය අගය කරන අතරම, සියල්ලන්ටම සමානාත්මතාවයකින් යුතුව කටයුතු කිරීමට තේ ශක්ති අරමුදල විසින් සියලු ප්‍රයත්න දරනු ලැබේ.

විගණන නිලධාරීන්

වර්ෂ 2015 ක් වූ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා තේ ශක්ති අරමුදලේ මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 කොටසේ ප්‍රතිපාදනවලට අනුව 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 (1) වගන්තිය අනුව විගණකාධිපතිගේ උපදෙස් ප්‍රකාරව සිදු කරන ලදී.

තේ ශක්ති ව්‍යාපෘති

තේ ශක්ති තේ කර්මාන්තශාලා

1. **බදුල්ල දිස්ත්‍රික්කය**
   - පස්සර තේ ශක්ති කම්හල

2. **නුවරඑළිය දිස්ත්‍රික්කය**
   - කැප්පෙටිපොළ තේ ශක්ති කම්හල
   - කොත්මලේ තේ ශක්ති කම්හල
   - මහවැලි තේ ශක්ති කම්හල

3. **කළුතර දිස්ත්‍රික්කය**
   - රයිගම් කෝරලේ තේ ශක්ති කම්හල

4. **ගාල්ල දිස්ත්‍රික්කය**
   - ඇල්පිටිය තේ ශක්ති කම්හල
   - වලහන්දුව තේ ශක්ති කම්හල
   - හිනිදුම තේ ශක්ති කම්හල

5. **රත්නපුර දිස්ත්‍රික්කය**
   - ගිලීමලේ තේ ශක්ති කම්හල
   - බලංගොඩ තේ ශක්ති කම්හල
   - පොතුපිටිය තේ ශක්ති කම්හල

6. **මාතර දිස්ත්‍රික්කය**
   - දෙනියාය තේ ශක්ති කම්හල
   - මාවරල තේ ශක්ති කම්හල

7. **මහනුවර දිස්ත්‍රික්කය**
   - යටිනුවර තේ ශක්ති කම්හල

8. **කෑගල්ල දිස්ත්‍රික්කය**
   - දැරණියගල තේ ශක්ති කම්හල
   - බුලත්කොහුපිටිය තේ ශක්ති කම්හල

9. **පොහොර සහ දේශීය තේ අලෙවි ව්‍යාපෘති**
   - පොහොර සහ දේශීය තේ අලෙවි මධ්‍යස්ථානය
   - මිශ්‍ර කිරීමේ කර්මාන්තශාලාව අරමණාගොල්ල, හොරණ

මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය කිරීම

2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී ආදායම රුපියල් මිලියන 48.07 කින් පහත යන අවස්ථාවක පරිපාලන වියදම් 2014 වර්ෂයට සාපේක්ෂව රුපියල් මිලියන 11.95කින් පහළ යෑම නිසා 2015 වර්ෂයේදී රු. මිලියන 39.23 දක්වා අලාභය පහළ ගොස් ඇත. මෙය ආයතනයට දරා ගැනීමට අසීරු වුවද අරමුදල සතු කිසිම ව්‍යාපෘතියක් කඩා වැටීමට ඉඩ නොදී පවත්වා ගෙන යාමට හැකි වීම අප ලද ජයග්‍රහණයකි.

2014 වර්ෂය සමඟ සැසඳීමේදී 2015 වර්ෂයේ මූල්‍ය පිරිවැය රු. මිලියන 9.99 කින් ඉහළ ගොස් ඇත. නමත් 2015 වර්ෂයේදී සමස්ත මෙහෙයුම් වියදම් රුපියල් මිලියන 11.95 කින් අඩු කර ගැනීමට සමත් වී ඇත. 2014 වර්ෂය සමඟ සැසඳීමේදී 2015 වර්ෂයේ ආදායම රු. මිලියන 48.07 කින් පහළ යාමක් පෙන්නුම් කරයි.

පසුගිය වර්ෂය හා සැසඳීමේදී උද්ධමනය ඉහළ ගොස් තිබුන ද මෙහෙයුම් වියදම් රු. මිලියන 11.95 කින් අඩු කර ගැනීමට පාලන අංශය සමත් වී ඇත.

2015 වසරේ දේශීය තේ නිෂ්පාදනය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ දත්තවලට අනුව දේශීය තේ නිෂ්පාදනය 2014 වසරට වඩා 2015 වසරේ තේ කිලෝ මිලියන 9.27 කින් පහත වැටී ඇත.

ශ්‍රී ලංකා තේ නිෂ්පාදනය 2015

කලාපය	2014 ප්‍රමාණය (කිලෝ මිලියන)	2014 ප්‍රමාණය ප්‍රතිශයක් ලෙස	2015 ප්‍රමාණය (කිලෝ මිලියන)	2015 ප්‍රමාණය ප්‍රතශයක් ලෙස
උඩරට	78.87	23.33%	75.42	22.9%
මැද රට	49.20	14.56%	50.96	15.53%
පහත රට	209.95	62.11%	202.37	61.57%
එකතුව	**338.02**		**328.75**	

මූලාශ්‍රය - ශ්‍රී ලංකා තේ මණ්ඩලය

කොළඹ තේ වෙන්දේසියේ සාමාන්‍ය මිල (කිලෝ ග්‍රෑම් එකක මිල)

තේ වගා කරන ප්‍රදේශ	තේ විකුණුම් මිල (රුපියල්)	
	2014	**2015**
උඩ රට	430.59	396.30
පහත රට	488.61	417.50
මැද රට	414.41	360.00

මූලාශ්‍රය ඵඳ ශ්‍රී ලංකා තේ මණ්ඩලය


කර්මාන්තශාලාවෙහි මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය

තේ ශක්ති අරමුදල පෙර වර්ෂ සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළ කර්මාන්තශාලා දහයෙන් එක් කර්මාන්තශාලාවක නිෂ්පාදන කටයුතු තාවකාලිකව නතර කරන ලද අතර, ක්‍රියාත්මක මට්ටමේ පවත්නා කර්මාන්තශාලා සංඛ්‍යාව 09ක් දක්වා අඩු විය.

තේ ශක්ති කම්හල් මඟින් තේ වෙන්දේසිය වෙත නිකුත් කළ මුළු තේ නිෂ්පාදනය

2013 - 2015

වර්ෂය	තේ නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම්)
2013	2,123,142
2014	1,697,683
2015	1,498,239




මූලාශ්‍රය - තේ ශක්ති කම්හල් අංශය

නිමි තේ ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්)

කම්හල	2013	2014	2015
රයිගම්කෝරලය	275,321	316,688	358,525
වලහන්දුව	238,541	141,814	108,880
මාවරල	82,126	55,380	
දෙනියාය	184,519	146,651	115,894
මහවැලි	228,485	188,065	275,144
පස්සර	298,578	209,097	309,379
පන්සලතැන්න	ඇල්කඩුව සමාගමට නැවත භාරදී ඇත		
කොත්මලේ	107,593	80,351.5	4,837
කැප්පෙට්පොල	309,395	206,235	270,036
හිනිදුම	බදු පදනම මත ලබාදී ඇත		
ඇල්පිටිය	216,272	102,435	159,632
බලංගොඩ	මෙහෙයුම් කටයුතු නවතා දමා ඇත		
ගිලීමලේ	බදු පදනම මත හිඳුරංගල කුඩා තේ වතු සංවර්ධන සමිතිය වෙත පවරා ඇත		
දැරණියගල	182,312	250,966.5	174,912
එකතුව	**2,123,142**	**1,697,683**	**1,777,239**


කිලෝග්‍රෑම්



ඉහත වගුව අනුව 2015 වර්ෂයේදී කම්හල් කිහිපයක පමණක් නිමි තේ නිෂ්පාදනය වැඩි වීමක් සිදුව ඇත. 2014 වර්ෂයට වඩා 2015 වර්ෂයේදී නිෂ්පාදිත මුළු නිමි තේ ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 79,556 කින් වැඩි වීමක් සිදුව ඇත.

නිමි තේ නිමවුම් ප්‍රතිශතය %

කම්හල	2013 %	2014 %	2015 %
රයිගම්කෝරලය	20.31	20.58	22.16
වලහන්දුව	20.84	20.74	20.65
මාවරල	20.50	20.68	
දෙනියාය	20.33	20.55	20.51
මහවැලි	21.13	21.96	21.82
පස්සර	21.90	22.04	22.57
පන්සලතැන්න	ඇල්කඩුව සමාගමට නැවත භාරදී ඇත		
කොත්මලේ	21.17	20.62	20.97
කැප්පෙටිපොල	21.37	21.36	21.70
හිනිදුම	-	-	-
ඇල්පිටිය	21.05	20.57	20.04
බලංගොඩ	මෙහෙයුම් කටයුතු නවතා දමා ඇත		
ගිලිමලේ	බදු පදනම මත හිඳුරංගල කුඩා තේ වතු සංවර්ධන සමිතිය වෙත පවරා ඇත		
දැරණියගල	20.65	20.53	20.94
එකතුව	**20.98**	**21.00**	**21.15**



2014 හා 2015 වර්ෂවල උඩරට කලාපයේ පිහිටි තේ කම්හල් සහ පහතරට කලාපයේ රයිගම්කෝරලේ තේ කම්හල අපේක්ෂිත නිමි තේ ප්‍රතිශතය අත් කර ගෙන ඇත. 2015 වර්ෂයේ දී කම්හල් පද්ධතියෙන් අවම නිමි තේ ප්‍රතිශතය ලබා ගෙන ඇත්තේ ඇල්පිටිය තේ කම්හල වන අතර, වැඩිම නිමි තේ ප්‍රතිශතය වාර්තා වී ඇත්තේ පස්සර තේ කම්හලිනි. එම වර්ෂයේදී නිමි තේ ප්‍රතිශතය අඩු කම්හල් නිසා ඇති වූ බලපෑම තේ ශක්ති කර්මාන්තශාලා පද්ධතියේ දිගින් දිගටම පාඩු ලැබීමට හේතු වී ඇත.


කලාපීය විකුණුම් මිල / ශුද්ධ විකුණුම් සාමාන්‍ය /නිෂ්පාදන පිරිවැය - 2013 -2015

ලබා ගත් අමු දළු සමඟ සංසන්දනය කිරීමේදී නිෂ්පාදනය කරන ලද නිමි තේ ප්‍රමාණවත නොවන අතර, උඩරට සහ මැදරට කලාපවලට අයත් තේ කම්හල් මඟින් අරමුදල අපේක්ෂා කරන නිමි තේ ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් ලබා ද ඇත. පහතරට කලාපයට අයත් වලහන්දුව කම්හල හැර කිසදු කම්හලක් 2013 වර්ෂයේ ලාභ ලබා නොමැත. උඩරට කලාපවලින් කැප්පෙටිපොල සහ පස්සර තේ කර්මාන්තශාලා ලාභ ලබා ඇත. 2013 වර්ෂයට වඩා 2015 වර්ෂයේ අස්වැන්න ලබා ගත්ත ද 2015 වර්ෂයේ නිමි තේ නිෂ්පාදනය පහළ වැටීම මත අරමුදලට ලැබිය යුතු නිමි තේ ප්‍රමාණය ලබා දමට කම්හල් අපොහොසත් වී ඇත. එම නිසා කම්හල්වල ලාභදායීත්වය පහත යෑමට මෙම තත්ත්වය බෙහෙවින් බලපා ඇත.

තේ කිලෝවක් සඳහා මිල ප්‍රමාණය


කම්හල	කලාපීය විකුණුම් මිල (රු)	ශුද්ධ විකුණුම් (රු)	නිෂ්පාදන පිරිවැය (රු)
රයිගම්කෝරලය	470.55	448.51	478.37
වලහන්දුව	470.55	452.43	450.88
මාවරල	470.55	422.24	548.88
දෙනියාය	470.55	448.22	492.11
මහවැලි	398.53	358.69	419.07
පස්සර	408.15	382.91	366.68
කොත්මලේ	415.67	356.65	423.52
කැප්පෙටිපොල	408.15	375.55	361.59
ඇල්පිටිය	470.55	455.42	473.74
දැරණියගල	470.55	409.67	460.04

කලාපීය විකුණුම් මිල / ශුද්ධ මිල සාමාන්‍ය / නිෂ්පාදන පිරිවැය - 2013



කලාපීය විකුණුම් මිල/ශුද්ධ මිල සාමාන්‍ය/නිෂ්පාදන පිරිවැය - 2014 - නිමි තේ කිලෝවක් සඳහා

කම්හල	කලාපීය විකුණුම් මිල (රු)	ශුද්ධ විකුණුම් (රු)	නිෂ්පාදන පිරිවැය (රු)
රයිගම්කෝරලය	488.21	431.25	483.02
වලහන්දුව	488.21	436.95	537.70
මාවරල	488.21	441.97	644.51
දෙනියාය	488.21	441.97	527.22
මහවැලි	404.85	370.71	428.92
පස්සර	419.94	372.27	382.53
කොත්මලේ	432.03	354.11	488.36
කැප්පෙටිපොල	419.94	358.92	391.10
ඇල්පිටිය	488.21	433.64	565.26
දැරණියගල	461.86	406.53	472.53




2014 වර්ෂයේ ක්‍රියාත්මක සියළු කම්හල් අලාභදායී තත්ත්වයට පත්වීම නිසා තේ ශක්ති අරමුදල විශාල මුල්‍ය අර්බුදයකට මුහුණ දීමට සිදු වීම ඉමහත් ගැටළුවකි.

කලාපීය විකුණුම් මිල කෙරෙහි අරමුදලේ අවධානය යොමු නොකිරීම හේතුවෙන් නිෂ්පාදන පිරිවැය ඉහළ ගොස් කම්හල්වල ශුද්ධ විකුණුම් සාමාන්‍ය අඩුවීම මත කම්හල් අලාභදායී තත්ත්වයට පත්ව ඇත.

කලාපීය විකුණුම් මිල/ශුද්ධ මිල සාමාන්‍ය/නිෂ්පාදන පිරිවැය - 2015 - නිමි තේ කිලෝවක් සඳහා


කම්හල	කලාපීය විකුණුම් මිල (රු)	ශුද්ධ විකුණුම් (රු)	නිෂ්පාදන පිරිවැය (රු)
රයිගම්කෝරලය	416.44	370.34	411.96
වලහන්දුව	416.44	380.36	494.87
මාවරල	-	-	-
දෙනියාය	416.44	373.20	474.87
මහවැලි	365.28	322.67	340.11
පස්සර	361.13	324.90	331.6
කොත්මලේ	407.02	330.02	1884.61
කැප්පෙට්පොල	361.13	322.66	340.6
ඇල්පිටිය	416.44	335.28	430.95
දැරණියගල	416.44	374.58	

ලබා ගන්නා ලද අමු දළු ප්‍රමාණය වැඩි වුවද කම්හල්වල තේ නිෂ්පාදනයේදී සිදු වූ අඩු පාඩුකම් නිසාවෙන් එම අමු දළුවලට සාපේක්ෂව අපේක්ෂිත නිමි තේ නොලැබීම සහ නිෂ්පාදන පිරිවැය ඉහළ යාම 2015 වර්ෂයේ අලාභ ලැබීමට හේතු විය.



කම්හල් අංශය ලාභ / පාඩු (රු) 2013 - 2015

කම්හල	ලාභ/පාඩු (රු.)		
	2013	**2014**	**2015**
රයිගම්කෝරලය	(8,221,085.06)	(16,396,360)	(14,923,000)
වලහන්දුව	369,738.55	(14,287,056)	(13,221,244)
මාවරල	(10,400,436.64)	(11,216,876)	(7,613,862)
දෙනියාය	(8,098,538.91)	(12,501,704)	(11,783,383)
මහවැලි	(13,795,924.30)	(10,947,642)	(4,797,294)
පස්සර	4,845,920.94	(2,145,770)	(2,073,488)
පන්සලතැන්න	ඇල්කඩුව සමාගමට නැවත භාරදී ඇත		
කොත්මලේ	(7,194,743.91)	10,787,194	(8,092,037)
කැප්පෙටිපොල	4,319,154.20	(6,636,247)	(4,844,243)
හිනිදුම	-	-	-
ඇල්පිටිය	(3,962,103.04)	(13,482,523)	(15,272,218)
බලංගොඩ	මෙහෙයුම් කටයුතු නවතා දමා ඇත		
ගිලීමලේ	බදු පදනම මත හිඳුරංගල කුඩා තේ වතු සංවර්ධන සමිතිය වෙත පවරා ඇත		
දැරණියගල	(9,183,055.44)	(23,227,045)	(11,443,239)
එකතුව	**(51,321,073.61)**	**(121,628,417)**	**(94,064,008)**




තේ කම්හල් පද්ධතියේ කම්හල් 03ක් 2013 වර්ෂයේදී ලාභ ලැබූ නමුත් 2014 සහ 2015 වර්ෂවලදී සියළුම කම්හල් අලාභ ලැබීම තේ ශක්ති අරමුදල මුල්‍ය අර්බුදයට ලක් වීමට ප්‍රධාන හේතුව ලෙස දැක්විය හැක.

මෙම තත්ත්වය හේතු කොට ගෙන කුඩා තේ වතු හිමියන් තේ ශක්ති අරමුදලෙන් ක්‍රම ක්‍රමයෙන් බැහැර වීම සිදුව ඇත.

තේ ශක්ති පොහොර ව්‍යාපෘතිය

පොහොර මිලදී ගැනීම

වර්ගය	ප්‍රමාණය (මෙ. ටො.)		
	2013	**2014**	**2015**
සල්ෆේට් ඔෆ් ඇමෝනියා		130.00	45.00
ට්‍රිපල් සුපර් පොස්පේට්	-	-	-
සන්ක	-	-	-
යුරියා	185.00	542.90	240.00
එප්පාවල රොක් පොස්පේට්	-	120.00	120.00
මියුරේට් ඔෆ් පොටෑෂ්	40.00	252.50	105.00
ඩොලමයිට්	239.75	279.75	184.90
එකතුව	**464.75**	**1,325.15**	**694.90**



2013 වර්ෂයේ පැවති මූල්‍ය හිඟතාවය නිසා ණයවර ලිපි මඟින් පොහොර ආනයනය තාවකාලිකව අත්හිටවීම සිදුකලත් අවශ්‍ය ප්‍රධාන නිමි තේ පොහොර සහ පොහොර මිශ්‍ර සකස් කිරීම සඳහා අවශ්‍ය යුරියා, මියුරේට් ඔෆ් පොටෑෂ්, ඇමෝනියම් සල්ෆේට් යන මූලික පොහොර ගිවිසුම් ප්‍රකාරව ලංකා පොහොර සමාගමෙන් මිලදී ගන්නා ලදී.


පොහොර විකුණුම්

වර්ෂය	ප්‍රමාණය (මෙ. ටො.)	වටිනාකම (රු.)
2013	1,340	30,165,082.50
2014	1,440.01	30,880,997.00
2015	714.69	14,597,392.00

තේ ශක්ති පොහොර අලෙවිය 2014 වර්ෂය සමඟ සංසන්දනය කිරීමේදී 2015 වර්ෂයේදී මෙ. ටො. 725.32 ක අඩු වීමක් පෙන්නුම් කර ඇත. ඒ අනුව, එහි වටිනාකම ද පෙර වර්ෂයට වඩා රු. 16,283,605.00ක අඩුවීමක් පෙන්නුම් කර ඇත.

පොහොර නිෂ්පාදනය (Mt)

	2013	**2014**	**2015**
නිෂ්පාදනය (මෙ. ටො.)	980.88	1,118.63	497.46




නිෂ්පාදනය (Mt)

හොරණ අරමණාගොල්ල පොහොර ගබඩාවේ පොහොර නිෂ්පාදනය සිදු කරන අතර, නිෂ්පාදනය 2013 වර්ෂයට සාපේක්ෂව 2014 දී මෙ. ටො. 137.75 වර්ධනයක් අත්පත් කර ගෙන ඇත. 2015 වර්ෂයේදී සමස්ථ නිෂ්පාදනය මෙ. ටො. 497.46 දක්වා පහත වැටී ඇත. 2013, 2014 වර්ෂ සමඟ සැසඳීමේදී අඩුම පොහොර නිෂ්පාදනය සිදු කර ඇත්තේ 2015 වර්ෂයේදී වන අතර, වැඩිම පොහොර නිෂ්පාදනය සිදු කර ඇත්තේ 2014 වර්ෂයේදීය.

දේශීය තේ විකුණුම්

	2013	2014	2015
වටිනාකම (රු)	2,830,159	2,848,418	3,713,253




2014 වර්ෂය සමඟ සැසඳීමේදී 2015 වසරේ දේශීය තේ විකුණුම් අංශයේ අලෙවිය වැඩි වීමක් පෙන්නුම් කර ඇත. එය සටහනින් දක්වා ඇති අතර, 2014 වසර සමඟ සැසඳූ විට 2015 අලෙවිය රු. මිලියන 0.86 කින් ඉහළ යාමක් පෙන්නුම් කර ඇත.

අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් දියත් කිරීම මඟින් හා තේවල ගුණාත්මක බව වැඩි කිරීම මඟින් 2016 වසරේ අලෙවිය තවදුරටත් වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. තේ අලෙවි ආදායම ලෙස බලන කල 2013 වසරේ සිට 2015 වසර දක්වා සාපේක්ෂව වැඩි වීමක් දක්නට ඇති අතර, එය අලෙවි අංශයේ ඉහළ ප්‍රවණතාවයක.

තේ ශක්ති සුභසාධන ආරක්ෂණ ක්‍රමය රක්ෂණ ප්‍රතිලාභ ගෙවීම් 2013 – 2015

	ස්වාභාවික මරණ	හදිසි අනතුරු මරණ	වැඩිහිටි දීමනා (මරණ)	වැඩිහිටි හදිසි අනතුරු මරණ	සැත්කම්	අකර්මන්‍ය අංශභාග	හදිසි අනතුරු අකර්මන්‍ය
	රු. **25,000.00**	රු. **100,000.00**	රු. **5,000.00**	රු. **10,000.00**	රු. **10,000.00** සිට රු. **200,000.00**	රු. **50,000.00** සිට රු. **200,000.00**	රු. **50,000.00** සිට රු. **200,000.00**
	ප්‍රතිලාභීන් සඳහා ගෙවීම්						
2013	264	11	349	2	28	10	5
2014	175	13	285	2	17	9	5
2015	192	12	299	3	19	5	7
මුළු එකතුව	**631**	**36**	**933**	**7**	**64**	**24**	**17**

පතිලාභ ගෙවීම් විස්තරය 2013 – 2015



තේ ශක්ති අරමුදල මඟින් කුඩා තේ වතු හිමියන් වෙත 2002 වසරේ තේ ශක්ති කොටස් නිකුත් කිරීම ආරම්භ කර ඇති අතර, කුඩා තේ වතු හිමියන්ට කොටස් නකුතුවෙන් අරමුදල ලද මුළු මුදල රු. මිලියන 208ක් විය. 2013 වර්ෂයේ සිට 2015 වසර අවසන් වනවිට රක්ෂණ ප්‍රතිලාභ ලෙස කුඩා තේ වතු හිමියන් 1,711ක් සඳහා රු. මිලියන 3.31 මුදලක් ගෙවා ඇත.

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය	සටහන	2015	2014
ආදායම	6	573,519,262	621,589,674
විකුණුම් පිරිවැය		(552,517,570)	(611,323,143)
දල ලාභය		**21,001,692**	**10,266,531**
වෙනත් ආදායම්	7	43,844,841	44,085,060
විකුණුම් හා බෙදාහැරීමේ වියදම්		(14,928,507)	(15,508,944)
පරිපාලන වියදම්		(188,377,711)	(200,329,899)
මෙහෙයුම් ලාභය / (අලාභය)		**(138,459,686)**	**(161,487,253)**
පොලී ආදායම	8	394,909	6,617,864
පොලී වියදම	8	(20,468,018)	(16,704,848)
රාජ්‍ය පරිත්‍යාග ලියා හැරීම්		119,300,503	43,750,503
බදු පෙර ලාභය / (අලාභය)	9	**(39,232,292)**	**(127,823,734)**
ආදායම් බදු වියදම	10		
වසරේ ලාභය / (අලාභය)		**(39,232,292)**	**(127,823,734)**
කොටසක මූලික ඉපයීම / (අලාභය) (රු.)	11	**(1.90)**	**(6.20)**
වසරේ ලාභය / (අලාභය)		(39,232,292)	(127,823,734)
වෙනත් විස්තීර්ණ ආදායම			
වෙනත් විස්තීර්ණ ආදායම් එකතුව			
වසරේ විස්තීරණ ආදායම් වල (ලාභ / අලාභ) එකතුව		**(39,232,292)**	**(127,823,734)**

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

	සටහන	2015	2014
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	12	285,261,613	330,775,955
අස්පෘශ්‍ය වත්කම්	13	2,600,000	2,435,000
ආයෝජන දේපල	14	33,433,585	16,014,636
පරිනත / අපරිනක වගාව	15	14,158,054	13,427,908
ස්ථාවර තැන්පතුවල ආයෝජනය		14,879,240	8,411,979
ජංගම නොවන වත්කම් එකතුව		**350,332,493**	**371,065,477**
ජංගම වත්කම්			
භාණ්ඩ තොග	17	69,590,593	114,050,930
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ	18	270,897,621	263,052,111
ව්‍යවස්ථාපිත ලැබිය යුතු දෑ	19	2,790,822	3,415,813
වෙනත් මූල්‍ය වත්කම්			
මුදල් හා මුදල්වලට සමාන දෑ	20	3,181,092	6,891,350
ජංගම වත්කම් එකතුව		**346,460,128**	**387,410,203**
වත්කම් එකතුව		**696,792,620**	**758,475,681**
හිමිකම් හා බැරකම්			
හිමිකම්			
කොටස් ප්‍රාග්ධනය	21	206,014,150	206,014,150
ප්‍රත්‍යාගණන සංචිතය	21	50,249,773	50,249,773
රඳවාගත් ඉපැයුම් (හරට)	21	(367,912,464)	(328,680,172)
හිමිකම් එකතුව		**(111,648,540)**	**(72,416,249)**
ජංගම නොවන බැරකම්			
සාමාජික දායක මුදල් අරමුදල	22	135,221,950	135,184,750
රජයේ ප්‍රදාන	23	262,503,018	331,803,521
සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම (බදු කුලී පෙර ගෙවුම්)	24	48,833,264	
පොලී සහිත ණයගැනීම් - (ජංගම නොවන කොටස)	25	6,008,533	13,455,505
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම	26	28,521,886	26,431,382
ජංගම නොවන බැරකම් එකතුව		**481,088,651**	**506,875,158**
ජංගම බැරකම්			
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	27	309,758,086	315,491,677
පොලී සහිත ණය ගැනීම් - (ජංගමකොටස)	25		4,925,892
ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ	28	4,545,276	3,599,202
බැංකු අයිරා	20	13,049,148	
ජංගම බැරකම් එකතුව		327,352,510	324,016,772
හිමිකම් සහ බැරකම් එකතුව		**696,792,620**	**758,475,681**

ගිණුම් සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

දේශබන්දු විජේරත්න දෙවගෙදර	නෙවිල් රත්නායක	පී.ජී.ආර්. තිස්ස
සභාපති	ප්‍රධාන විධායක නිලධාරී (වැඩබලන)	ප්‍රධාන ගණකාධිකාරී
තේ ශක්ති අරමුදල	තේ ශක්ති අරමුදල	තේ ශක්ති අරමුදල

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රත්‍යාගණන සංචිතය	රඳවාගත් ඉපැයුම් (හරට)	එකතුව
2014 දෙසැම්බර් 31 දිනට ශේෂය	**206,014,150**	**50,249,773**	**(328,680,172)**	**(72,416,249)**
වර්ෂයේ ලාභය			**(39,232,292)**	
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	**206,014,150**	**50,249,773**	**(367,912,464)**	**(72,416,249)**

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දක්වයි.

5 සිට **29** දක්වා පිටුවල එන මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය		2015	2014
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය			
බදු පෙර ලාභය		(39,232,292)	(127,823,734)
පහත කරුණු සඳහා ගැළපීම් ;			
ක්ෂය වෙන් කිරීම්		31,858,162	32,134,270
රාජ්‍ය ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම		(119,300,503)	(43,750,503)
පරිනත වගා මත ක්‍රමක්ෂය කිරීම		860,510	592,250
පරිනත වගා මත ක්‍රමක්ෂය කිරීම			
පරිනත වගා මත ක්‍රමක්ෂය කිරීම			
බදු කුලී ක්‍රමක්ෂය කිරීම – සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම		(1,166,736)	
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන		5,791,088	9,418,925
පොලී ආදායම		(394,909)	(6,617,864)
පොලී වියදම්		20,468,018	16,704,848
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය		**(101,116,662)**	**(119,341,808)**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්			
භාණ්ඩ තොග		44,460,337	41,403,594
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ		(7,845,510)	(1,814,314)
ව්‍යවස්ථාපිත ලැබිය යුතු දෑ		624,991	390,215
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ		(5,733,592)	57,876,825
ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ		946,074	1,395,901
මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල්		**(68,664,361)**	**(20,089,588)**
ගෙවූ පාරිතෝෂික		(3,700,585)	(3,262,765)
ගෙවූ පොලී මුදල්		(20,468,018)	(16,704,848)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහය		**(92,832,964)**	**(40,057,202)**
ආයෝජන ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය			
දේපල, පිරියත හා උපකරණ අත්පත්කර ගැනීම		(3,762,769)	(1,056,447)
අස්පෘශ්‍ය වත්කම් අත්පත්කර ගැනීම		(165,000)	
නොනිමි ප්‍රාග්ධන වැඩ			(1,695,678)
අපරිනත වගාවන් අත්පත්කර ගැනීම		(1,590,656)	(2,203,652)
ස්ථිර තැන්පතු හා වෙනත් මූල්‍ය වත්කම් කල් පිරීමෙන් ලත් මුදල		(6,467,261)	52,515,085
රජයේ ප්‍රදාන ලැබීම්		50,000,000	25,550,000
සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමෙන් බදු කුලී කලින් ලැබීම්		50,000,000	
ලද පොලිය		394,909	6,617,864
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යොදන ලද ශුද්ධ මුදල		**88,409,223**	**79,727,172**
මූල්‍ය ක්‍රියාකාරම්වල මුදල් ප්‍රවාහය			
සාමාජිකයන්ගේ දායක මුදල්		37,200	95,600
ලබාගත් කාලීන ණය		-	16,332,302
ණය ආපසු ගෙවීම		(12,372,864)	(11,406,410)
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යොදන ලද ශුද්ධ මුදල		**(12,335,664)**	**5,021,492**
වර්ෂය තුළදී මුදල් හා මුදල් වලට සමාන දෑවල ශුද්ධ වෙනස්වීම්		**(16,759,405)**	**44,691,462**
නිවැරදි කිරීමේ ගැලපුම			
වර්ෂය ආරම්භයේදී පැවති මුදල් සහ මුදල් වලට සමාන දෑ		6,891,350	(37,800,112)
වර්ෂය අවසානයේදී පැවති මුදල් සහ මුදල් වලට සමාන දෑ	**(සටහන 20)**	**(9,868,056)**	**6,891,350**

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දක්වයි.

5 සිට 29 දක්වා පිටුවල එන මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

තේ ශක්ති අරමුදල
2015 දෙසැම්බර් 31වනදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

1. ආයතනික තොරතුරු

1.2 පොදුකරුණු

මෙහි මින් මතුවට "අරමුදල" ලෙස හඳුන්වනු ලබනතේ ශක්ති අරමුදල 2000 අංක 47 දරණ පාර්ලිමේන්තු නත යටතේශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරන ලද ශ්‍රී ලංකාවේ ස්ථාපිත අරමුදලකි. අරමුදලේ ලියාපදිංචි කාර්යාලය අංක 384, පන්නිපිටිය පාර, පැලවත්ත, බත්තරමුල්ල යන ස්ථානයෙහි පිහිටා ඇති අතර, ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 70, පාර්ලිමේන්තුව පාර, පැලවත්ත, බත්තරමුල්ල යන ස්ථානයෙහි පිහිටා ඇත මෙම අරමුදලේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ තරඟකාරී වෙළඳපල තුළ ගුණාත්මක තේ නිෂ්පාදනය මඟින් කුඩා තේ වතු හිමියන්ට සාධාරණ මිලකට යෙදවුම් ලබාදීම තුළින් ඔවුන් විසින් නිපදවන තේ දළු සඳහා හොඳ මිලක් ලබා දීම හරහා ඔවුන්ගේ ආර්ථික සහ සමාජ තත්ත්වය නගා සිටුවීමයි. මෙම අරමුදලේ ව්‍යාපාරික ස්ථාන හොරණ, මාතර, ගාල්ල, බදුල්ල, නුවර, නුවරඑළිය සහ මාතලේ යන දිස්ත්‍රික්කවල පිහිටුවා ඇත.

1.3 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය

අරමුදලේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ තේ සහ පොහොර නිෂ්පාදනය කිරීම හා අලෙවි කිරීමයි

1.4 සේවක සංඛ්‍යාව

වර්ෂයඅවසානය වන විට මෙම අරමුදලේ ස්ථිර සේවකයින් සංඛ්‍යාව 558 ක් විය

1.5 නිකුත් කිරීම සඳහා අවසර දෙන ලද දිනය

2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා තේ ශක්ති අරමුදලේ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා 2016.10.19 දිනැති අධ්‍යක්ෂක මණ්ඩල යෝජනාවක් අනුව බලය පවරන ලදි

2. විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

2.1 මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම

තේ ශක්ති අරමුදලේ ("අරමුදල") මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකසා ඇත ඓතිහාසික පිරිවැය සම්ප්‍රදාය යටතේ මූල්‍ය ප්‍රකාශ සකසා ඇති අතර දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය සාධාරණ වටිනාකම මඟින් නව්‍යකරණය කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සැකසීම සඳහා අත්‍යාවශ්‍ය ගිණුම් ඇස්තමේන්තු භාවිත කිරීම අවශ්‍ය කෙරේ. ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීමේ ක්‍රියාදාමය තීරණය කිරීම සඳහා කළමනාකාරිත්වය කටයුතු කළ යුතුවේ. ඉහළ තලයේ මැදිහත්වීමක් හෝ පෙළඹවීමක් අවශ්‍ය කරන අංශ හෝ මූල්‍ය ප්‍රකාශවලට වැදගත් වන ඇස්තමේන්තු හා උපකල්පිත අවශ්‍ය අංශ සටහන් අංක 4හි දක්වා ඇත.

2.2 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විවිධ්‍යයන් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශවල කාලසීමාවන්ට අදාළව අඛණ්ඩව ඉදිරිපත් කර ඇති අතර, අන්‍යාකාරයකින් සඳහන් කර නොමැතිනම්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට මාරු වූ දිනයේ මූල්‍ය තත්ත්වය ආරම්භක ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අනුව සකසා ඇත.

පසුගිය වසරේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය කිරීම මනාව ඉදිරිපත් කිරීම සඳහා අදාළ වන පරිදි, ප්‍රවර්තන වර්ෂයට ගැලපෙන ලෙස සංශෝධනය කර ඇත.

2.3 විදේශීය ව්‍යවහාර මුදල් පරිවර්තනය

(අ) ක්‍රියාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්

මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් ගණුදෙනු සහ ශේෂයන් මනිනු ලබන්නේ, ආයතනය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයේ ව්‍යවහාර මුදල භාවිත කිරීමෙනි. අරමුදල් ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.

(ආ) ගණුදෙනු හා ශේෂ

විදේශීය මුදල් ගණුදෙනු ක්‍රියාත්මක මුදල් බවට ගණුදෙනු සිදු කරන දිනය වන විට පැවතෙන විනිමය අනුපාත භාවිත කර පරිවර්තනය කර ඇත. එවැනි ගණුදෙනු පියවීම නිසා ඇති වන විදේශීය විනිමය වාසි හා පාඩු සහ විදේශීය මුදල් තුළ අඩංගු මූල්‍ය වත්කම් හා බැරකම්වල වසර අවසාන විනිමය අනුපාත පරිවර්තනය මඟින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇත.

ක්‍රමක්ෂය කළ පිරිවැයවල විචල්‍යයන්ට අදාළ පරිවර්තන වෙනස්කම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇත.

2.4 දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ වත්කම් පිහිටි ස්ථානය වෙත ගෙනයාමට සෘජුව දායක වූ කිසියම් හෝ පිරිවැය ද හා කළමනාකාරිත්වය මඟින් අදහස් කරන ලද ආකාරයට ක්‍රියාවට නංවාලීමට ඇති හැකියාවට අදාළ කොන්දේසි ඇතුළුව පිරිවැය අගය අනුව මූලිකව හඳුනා ගෙන ඇත.

දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කළ වටිනාකම අනුව 2011**දෙ**සැම්බර් 31 දිනට පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සැකසූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ දක්වා ඇත. දේපල, පිරියත හා උපකරණවල ප්‍රත්‍යාගණනය කළ වටිනාකම කල්පිත පිරිවැයක් ලෙස ප්‍රත්‍යාගණනය කළ දිනට සාධාරණ අගයට වඩාත් පුළුල් ලෙස සන්සන්දනාත්මකව සැලකීමට අරමුදල තීරණය කර ඇත. කල්පිත පිරිවැය, දේපල, පිරියත හා උපකරණ ලෙස සැලකීමෙන් පසුකාලීනව පිරිවැය රහිත සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානි පාඩු ගණනය කෙරේ.

පසුකාලීන පිරිවැය වත්කම් ධාරණ අගයට ඇතුළත් කර හෝ වත්කමක් ලෙස හඳුනා ගෙන ඇත. ඒ අනුව, අයිතමයක් හා බැඳුනු ඉදිරි ආර්ථික වාසි අත්වන අවස්ථාවක පමණක් ඒවා අරමුදලට එකතු විමටත් ඒ අනුව, අයිතමයක් පිරිවැය විශ්වාසිදායකව ගණනය කිරිමට හැකි වනු ඇත. වෙනත් සියළු පිළිසැකසුම් හා නඩත්තුව ඒවා සිදු කළ මූල්‍ය කාල සීමාව තුළ දි විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කෙරේ.

ඉඩම ක්ෂය කිරීමක් සිදුනොකරන අතර, පහත දැක්වෙන පරිදිඅනෙකුත් වත්කම් ක්ෂයවීම්, ඒවායෙහි ඇස්තමේන්තුගත ඵලදායී ආයු කාලය මත ඒවායේ පිරිවැය වෙන් කිරීම සඳහා සරල රේඛීය ක්‍රමය භාවිතා කරමින් ගණනය කරනු ලැබේ.

වත්කම් කාණ්ඩය	**ප්‍රත්‍යාගණන දිනට අපේක්ෂිත ඵලදායී ආයු කාලය**
ගොඩනැගිලි	වර්ෂ40
පිරියත හා යන්ත්‍රෝපකරණ	වර්ෂ13
ලි බඩු සහසවිකුරු	වර්ෂ10
මෝටර් රථ	වර්ෂ10
පරිනත වගාව - තේ	වර්ෂ33

වත්කමක ධාරණ අගය එහි අපේක්ෂිත ආපසු අය කරගත හැකි මුදලට වඩා වත්කමක ධාරණ වටිනාකම වැඩිවන අවස්ථාවක එය අයකර ගත හැකි මුදලක් ලෙස ක්ෂණිකව ලියා තබනු ලබයි.

2.5 අස්පෘෂ්‍ය වත්කම්

මිලදී ගත් පරිගණක මෘදුකාංග විශේෂිත මෘදුකාංග හා පද්ධති භාවිතයට ගැනීම සඳහා හා මිලදී ගැනීමට සිදු කළ පිරිවැය මත පදනම්ව ප්‍රාග්ධනිත කර ඇත. මිලදී ගත් අස්පෘෂ්‍ය වත්කම් ඒවායේ පිරිවැය අගයට දක්වා ඇත. මිලදී ගත් අස්පෘෂ්‍ය වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානි පාඩු අඩු කර පිරිවැය අගයට දක්වා ඇත. මෙම පිරිවැය ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ආයුකාලය මත පහත පරිදි ක්‍රමක්ෂය කර ඇත.

පරිගණක මෘදුකාංගවර්ෂ 5

පරිගණක මෘදුකාංග නඩත්තුවට අදාළ පිරිවැය සිදු කළ වියදමක් ලෙස හඳුනා ගෙන ඇත.

ආයෝජනදේපල
ආයෝජන දේපල යනු කුලී ආදායම් ඉපයීම සඳහා හෝ ප්‍රාග්ධන අගය වැඩිවීම හෝ ඒ දෙකටම අයත් දේපල වුවද ඒවා සාමාන්‍ය ව්‍යාපාර ක්‍රමය තුළින් විකිණීම සඳහා වන ඒවා නොවන අතර, භාණ්ඩ නිෂ්පාදනය හෝ සැපයීම සඳහා හෝ පරිපාලන කටයුතු සඳහා භාවිත කෙරේ.

2015 දෙසැම්බර් 31 ට පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව සකසා ඇති මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ප්‍රත්‍යාගණන අගයට ආයෝජන දේපල ඉදිරිපත් කර ඇත. ආයෝජන දේපලවල ප්‍රත්‍යාගණන මුදල කල්පිත පිරිවැයක් ලෙස ප්‍රත්‍යාගණනය කළ දිනට සාධාරණ අගයට වඩාත් පුළුල් ලෙස සන්සන්දනාත්මකව ආයෝජන දේපල සැලකීමට අරමුදල තීරණය කර ඇත. කුලී ඉපැයීම සඳහා තබා ඇති ආයෝජන දේපල මූලිකව එහි පිරිවැයට මනිනු ලබන අතර, පසුව එම දේපල කිසියම් හානි පාඩුවක් වෙතොත් එය අඩු කර පිරිවැයට මනිනු ලැබේ.

ගොඩනැගිලිවල ක්ෂයවීම් ගණනය කරනු ලබන්නේ පහත දැක්වෙන පරිදි ඒවායේ පිරිවැය හෝ සැලකූ පිරිවැය ප්‍රතිපාදනය කිරීම සඳහා සරල රේඛීය ක්‍රමය භාවිත කරමිනි.

ආයෝජන දේපල වර්ෂ 29

2.6 ජීව විද්‍යාත්මක වත්කම් – පරිනත හා අපරිනතවගාව

ජීව විද්‍යාත්මක වත්කම්, පරිනත ජීව විද්‍යාත්මක වත්කම් හා අපරිනත ජීව විද්‍යාත්මක වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. අස්වැන්න නෙලිය හැකි වර්ග පරිනත ජීව විද්‍යාත්මක වත්කම් වේ. පරිනත ජීව විද්‍යාත්මක වත්කම් යනු අස්වැන්න ලබා දෙන හෝ නිතිපතා අස්වැන්න අත්කර දෙන ඒවා වේ. අපරිනත ජීව විද්‍යාත්මක වත්කම් යනු මෙතෙක් අස්වැන්න ලබා නොදෙන ඒවා වේ. තේ හා දැවමය වගාවන් ජීව විද්‍යාත්මක වත්කම් ගණයට අයත් වේ.

ඉඩම් සැකසීම, නව වගාව හා නැවත වගාව සහ පොහොර යෙදීම සඳහා පැල සිටුවීම හා අස්වැන්න නෙලීම අතර, කාලය තුළ දරන ලද පිරිවැය අපරිනත වගා ලෙස වර්ගීකරණය කර ඇත. මෙම අපරිනත වගාවන් සෘජු පිරිවැය සහ ආරෝපණය කළ හැකි පොදු කාර්ය සඳහා දක්වා ඇත.

ජීව විද්‍යාත්මක වත්කම්, භාරක ජීව විද්‍යාත්මක වත්කම් සහ පාරිභෝග්‍ය ජීව විද්‍යාත්මක වත්කම් ලෙස තවදුරටත් වර්ගීකරණය කෙරේ. භාරකජීව විද්‍යාත්මක වත්කම්වලට විකිණීමට හෝ අස්වැන්න නෙලීමට අදහස් නොකරන තේ පැල ඇතුළත් වන අතර, එහෙත්, අස්වනු ලබා දෙන කෘෂිකාර්මික නිෂ්පාදන වගා කිරීම සඳහා යොදා ගැනේ. ජීව විද්‍යාත්මක වත්කම්වලින් කෘෂිකාර්මික නිෂ්පාදන ලෙස අස්වනු නෙළීමට හෝ ජීව විද්‍යාත්මක වත්කම් ලෙස විකිණීමට ඇති දැව වගාව පාරිභෝග්‍ය ජීව විද්‍යාත්මක වත්කම්වලට ඇතුළත් වේ.

වර්ෂය තුළදී ඵල දරනු ලබන භාරකජීව විද්‍යාත්මක වත්කම් සඳහා දරන ලද වියදම් පරිනත වගාවන්ට මාරු කර ඇත. පාරිභෝග්‍ය ජීව විද්‍යාත්මක වත්කම් සඳහා සිදු කළ වියදම් මූලික හඳුනා ගැනීමේ දී වන පිරිවැයක් ලෙස දක්වා ඇත.

අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස ආයතනය විසින් වත්කම් පාලනය කරන අවස්ථාවකදී පමණක් අරමුදල ජීව විද්‍යාත්මක වත්කම් හඳුනා ගැනීම සිදු කරන අතර, වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ අරමුදලට ගලා ඒමට ඉඩ ඇති විට සහ වත්කම්වල සාධාරණ වටිනාකම හෝ පිරිවැය විශ්වසනීයව මැනිය යුතුය.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද රීතියට අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 (LKAS16) - දේපල, පිරියත සහ උපකරණ ප්‍රකාරව, භාරක ජීව විද්‍යාත්මක වත්කම් මනිනු ලබන්නේ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානි පාඩු ඇත්නම්, ඒවා පිරිවැයෙන් අඩු කිරීමෙනි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 41(LKAS 41) ප්‍රකාරව දැවමය වගාවන් මූලිකව හඳුනා ගැනීමට හා දක්වා සිටින එක් එක් කාලය අවසානයේ පිරිවැය අඩු කර සාධාරණ අගයට විකිණීමට ගණනය කරනු ලැබේ.

2.7 මූල්‍ය නොවන වත්කම්වල හානි පාඩු

වත්කම්වලට හානි පාඩු සිදුවී ඇත්දැයි නිශ්චය කර ගැනීම සඳහා දක්වා සිටින එක් එක් කාල සීමාව අවසානයේ, අරමුදලේ දේපල, පිරියත, උපකරණ, අස්පෘශ්‍ය වත්කම් හා ආයෝජන දේවල භාරක අගයන් අරමුදල සැලකිල්ලට ලක් කරයි. එවැනි කිසියම් හැඟවීමක් ඇති අවස්ථාවක, හානි පාඩු ප්‍රමාණය දැන ගැනීම සඳහා වත්කමෙහි අය කර ගත හැකි මුදල ඇස්තමේන්තු කෙරේ. පුද්ගල වත්කමක අය කර ගත හැකි මුදල ඇස්තමේන්තු කිරීමට නොහැකි වන අවස්ථාවක, මුදල් උත්පාදන ඒකකය (CGUs) කුමක්දැයි අරමුදල තීරණය කර වත්කම අයත් මුදල් උත්පාදන ඒකකයේ අය කර ගත හැකි මුදල ඇස්තමේන්තු කෙරේ.

අය කර ගත හැකි මුදල යනු සාධාරණ වටිනාකම, විකිණීමේ පිරිවැය හා භාවිත කිරීමේ වටිනාකම අඩු කල පසු ලැබෙන අගයයි. ඇස්තමේන්තු ගත ඉදිරි මුදල් ප්‍රවාහවල වටිනාකම තක්සේරු කිරීමේ දී, මුදල්වල කාලීන වටිනාකම්වල වෙළඳපල තක්සේරුව හුවා දක්වන මුදල් ප්‍රවාහ බදු පෙර වට්ටම් අනුපාතයට සත්‍ය වටිනාකමට හා ගැලපුම් කර නැති ඉදිරි මුදල් ප්‍රවාහ සඳහා වන වත්කමට අදාළ අවදානම් වට්ටම් කෙරේ.

වත්කමක ආපසු අයකර ගත හැකි මුදල එහි ධාරණ අගයට වඩා අඩුවෙන් ඇති අවස්ථාවක, වත්කමෙහි ධාරණ අගය එහි ආපසු අය කර ගත හැකි මුදලකට අඩු කෙරේ. හානි පාඩු විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ක්ෂණිකව හඳුනා ගැනේ.

2.8 මූල්‍යවත්කම්

(අ) වර්ගීකරණය

අරමුදල තම මූල්‍ය වත්කම් වර්ගීකරණය මූලික හඳුනා ගැනීමේ දී තීරණය කරන අතර, පහත දැක්වෙන ආකාරයට මූල්‍ය වත්කම් වර්ගීකරණය කෙරේ.

I. ණය සහ ලැබියයුතු දෑ

ණය සහ ලැබියයුතු දෑ යනු ස්ථීර හෝ නිශ්චය කළ හැකි ගෙවීම්වලින් සමන්විත ව්‍යුත්පන්න නොවන සක්‍රිය වෙළඳපලේ මුදා හැර නැති මූල්‍ය වත්කම් වේ. වාර්තා කරන දිනය අවසානයට පසුව මාස 12 කට වැඩි කල්පිරීමක් වන දෑ හැර ණය හා ලැබියයුතු දෑ සථ්‍ය වත්කම් තුළ අඩංගු වන අතර, ඒවා සථ්‍ය නොවන වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. අරමුදලේ ණය හා ලැබියයුතු දෑ අතර වෙළඳ හා වෙනත් ලැබියයුතු දෑ, කාලීන තැන්පත්/ අත්තිකාරම්/ පූර්ව ගෙවීම් හා තැන්පත්වල ආයෝජන සහ වාර්තාකරණ කාලසීමාව අවසානයේ මුදල් හා මුදල්වලට සමාන දෑඇතුළත්වේ.

(ආ) හඳුනාගැනීම හා මූලික මිනුම

ණය හා ලැබියයුතු දෑ ලෙස වර්ගීකරණය කර ඇති මූල්‍ය වත්කම් අරමුදල ගණුදෙනුව ආරම්භකළ දිනයේ සිට හඳුනා ගෙන ඇත. වෙනත් මූල්‍ය වත්කම් මූල්‍ය ලේඛණයේ ගිවිසුම් ප්‍රතිපාදනය සඳහා අරමුදල පාර්ශ්වකරුවෙකු බවට පත් වන වෙළඳ දිනයේදී හඳුනාගැනීමට ලක්කර ඇත.

මූල්‍ය වත්කම් මූලික වශයෙන් ගණුදෙනු පිරිවැයට සාජුවම බලපාන ලාභ හෝ පාඩු මඟින් සාධාරණ වටිනාකමක් ඇති වත්කම්වලදී සාධාරණ වටිනාකම එකතු කර ගණනය කෙරේ.

මූල්‍ය වත්කම් වලින් මුදල් ප්‍රවාහය ලබා ගැනීමට හිමිකම අහෝසි වී ඇති හෝ මාරු කර ඇති අවස්ථාවක මූල්‍ය වත්කම් නොසළකා හැරෙන අතර, මූල්‍ය වත්කම්වල හිමිකාරිත්වයේ සියලු අවදානම් හා වාසි පසුකාලිනව අරමුදලට හිමිවේ.

(ඇ) පසුකාලීනමිනුම

මූලික හඳුනා ගැනීමෙන් පසුව, හානි පාඩුසඳහා ප්‍රතිපාදනය අඩුකර,සඵල පොලී ක්‍රමය යොදා ගනිමින් ණය හා ලැබියයුතු දෑ ක්‍රමක්ෂය කරන ලද පිරිවැය මත මනිනු ලැබේ.

(ඈ) මූල්‍ය වත්කම්වල හානි පාඩු

මූල්‍ය වත්කමක් හානිවී ඇති බවට පරමාර්ථික සාක්ෂි තිබේද යන්න අරමුදල විසින් එක් එක් වාර්තාකරණ කාල සීමාව අවසානයේ තක්සේරුවක් සිදු කරනු ලැබේ. වත්කම(පාඩු ලබන අවස්ථාවක) මූලිකව හඳුනා ගැනීමෙන් අනතුරුව සිදුවීම් එකක් හෝ වැඩි ප්‍රමාණයක් ඇතිවීමේ ප්‍රතිඵලයක් ලෙස හානිය සඳහා පරමාර්ථික සාක්ෂි ඇති අවස්ථාවකදී පමණක් මූල්‍යමය වත්කමක් හානිවී, හානි පාඩු ඇති වන අතර, පාඩු සිදුවීම (හෝ සිදුවීම්) මඟින් විශ්වසනීය ලෙස තක්සේරු කළ හැකි මූල්‍ය වත්කමක ඇස්තමේන්තුගත ඉදිරි මුදල් ප්‍රවාහය කෙරේ බලපෑමක් ඇති කරවයි.

ක්‍රමක්ෂය වියදම් යටතේ රැගෙන යන ණය සහ ලැබිය යුතු දෑ සඳහා, අලාභයේ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කමේ ධාරණ අගයසහ මූල්‍ය වත්කම්වල මුල් සඵල පොලී අනුපාතයට වට්ටම් කර ඇති ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල (අනාගත ණය පාඩු හැර) වත්මන් වටිනාකම අතර, වෙනස ලෙසය. මූල්‍ය වත්කම්වල ධාරණ අගයඅඩු වන අතර, අලාභයේ ප්‍රමාණය විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

පසු අවස්ථාවකදී,හානි පාඩුප්‍රමාණය අඩු වුවහොත් එම අඩුවීම හානි පාඩු හඳුනා ගැනීමෙන් පසුව සිදු වූ සිදුවීමක් ලෙස සැලකිය හැකි අතර, මීට පෙර හඳුනාගත් අගය පහත වැටීමේ නිවැරදි කිරීම් සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගෙන ඇත.

2.9 භාණ්ඩ තොග

අ)ජීව විද්‍යාත්මක වත්කම් වල කෘෂිකාර්මික නිෂ්පාදන වලින් නිපදවූ නිමි භාණ්ඩ

පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට භාණ්ඩ තොග දක්වා ඇත. හරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමය භාවිත කරමින් පිරිවැය නිශ්චය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධිවිය හැකි වටිනාකම යනු නිමැයුම් පිරිවැය හා විකිණුම් වියදම් අඩු කර සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල ඇස්තමේන්තුගත විකුණුම් මිල වේ.

ආ)පොහොර

සහනාධාර අඩුකොට පිරිවැය මත භාණ්ඩ තොග දක්වා ඇත. බර තැබූ සාමාන්‍ය පිරිවැය ක්‍රමවේදය භාවිතා කරමින් පිරිවැය තීරණය කර ඇත. හරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමය භාවිත කරමින් පිරිවැය නිශ්චය කරනු ලැබේ. මිශ්‍ර පොහොරවල පිරිවැය තුළ අමුද්‍රව්‍ය, සෘජු ශ්‍රමය, වෙනත් සෘජු වියදම් හා ආශ්‍රිත නිෂ්පාදන පොදු කාර්ය අඩංගු වේ. ශුද්ධ උපලබ්ධි විය හැකි වටිනාකම යනු අදාළ විකිණුම් වියදම් අඩු කර සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල සහනාධාර වටිනාකම වේ.

ඇ)ජීව විද්‍යාත්මක වත්කම් වලින් නෙලාගත් කෘෂිකාර්මික නිෂ්පාදන

අස්වැන්න ලබන අවස්ථාවේ විකිණීම සඳහා කෘෂිකාර්මික නිෂ්පාදන පිරිවැය අඩුකර ඒවායේ සාධාරණ වටිනාකම අනුව මනිනු ලැබේ. කෘෂිකාර්මික නිෂ්පාදනවලින් ලත් නිමි හා අර්ධ නිමි භාණ්ඩ තොග, කෘෂිකාර්මික නිෂ්පාදනවල සාධාරණ වටිනාකමට පරිවර්තනය කිරීමේ පිරිවැය එකතු කිරීම මඟින් අගය කරනු ලැබේ.

2.10 වෙළඳලැබිය යුතුදෑ

වෙළඳ ලැබියයුතු දෑ යනු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී භාණ්ඩ විකිණීම වෙනුවෙන් ගණුදෙනුකරුවන්ගෙන් අයවීමට නියමිත මුදල්ය. සාමාන්‍ය ව්‍යාපාර මෙහෙයුම් ක්‍රමවේදය (වසරක් හෝ

ඊට අඩු කාලයක් තුළ) මඟින් මුදල් එකතු කර ගැනීමට අපේක්ෂා කරන අතර, වෙළඳඋපයගැනියන් සත්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. වෙළඳ ලැබියයුතු දෑ මූලිකව සාධාරණ වටිනාකම (ඉන්වොයිස් වටිනාකම) මත හඳුනාගෙන ඇති අතර, සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ලැබෙනු ඇතැයි විශ්වාස කරන අගය අඩුවීම් සඳහා ප්‍රතිපාදන සැලසීමකින් තොරව සත්‍ය ඉන්වොයිස් වටිනාකමට පසුකාලීනව ගණනය කරනු ලැබේ.

එක් එක් වාර්තාකරණ කාලය අවසානයේදි වෙළඳ ලැබියයුතු දෑ හානිවී ඇති බවට පරමාර්ථීක සාක්ෂි තිබේදැයි අරමුදල තක්සේරු කරනු ලැබේ. ගෙවීම් ඒකරාශි කිරීම, ණයකරුවන්ගේ සැළකියයුතු මූල්‍ය ගැටලු සහ ගෙවීම් පැහැර හැරීම ඇතුළු අරමුදලේ පසුගිය අත්දැකීම් වෙළඳ ලැබියයුතු දෑ හානිවීම පිළිබඳ පරමාර්ථීක සාක්ෂිවලට අඩංගු වේ. වෙළඳ ලැබියයුතු දෑ හානිවී ඇති අතර, හානිවීම පිළිබඳ පරමාර්ථීක සාක්ෂි තිබෙනම්, එකී හානිපාඩු සිදු වී ඇත. හානිවීමසඳහා වෙළඳ ලැබියයුතු දෑ වෙන් වෙන්ව තක්සේරු කර ඇත.

2.11 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ, මුදල් සහ මුදල් සමාන දෑ සඳහා අතේ ඇති මුදල්, බැංකු සමඟ කරන ලද කාලීන තැන්පතු, මාස තුනක මුල් කල්පිරීමක් සහිත හෝ ඊට අඩු බැංකු අයිරාවක් සහිත වෙනත් කෙටි කාලීන ඉතා ද්‍රවශීල ආයෝජන ඇතුළත් වේ.

2.12 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සාමාන්‍ය කොටස්, ස්කන්ධප්‍රාග්ධනයලෙස වර්ගීකරණය කර ඇත.

2.13 මූල්‍ය බැරකම්

අරමුදල, මූල්‍ය බැරකම් වෙනත් මූල්‍ය බැරකම්වලට වර්ගීකරණය කරනු ලැබේ. අරමුදලේ වෙනත් මූල්‍ය බැරකම්වලට වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ හා පොලී සහිත ණය ඇතුළත් වේ. වෙනත් මූල්‍ය බැරකම් මුලින් හඳුනාගනු ලබන්නේ සාධාරණ වටිනාකමකින් සහ සෘජුව ආරෝපණය කළ හැකි ඕනෑම ගනුදෙනු පිරිවැයක් යටතේය. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, මෙම මූල්‍ය බැරකම් සඵල පොලී ක්‍රමය භාවිත කරමින් ක්‍රමක්ෂය කළ පිරිවැයට ගණනය කෙරේ.

අරමුදල එහි කොන්ත්‍රාත් බැඳීම් අවසන් වූ විට, අවලංගු කළ විට හෝ කල් ඉකුත් වූ විට මූල්‍ය වගකීමක් හඳුනා නොගනී.

2.14 වෙළඳ ගෙවියයුතු දෑ

වෙළඳ ගෙවිය යුතුදෑ යනු සැපයුම්කරුවන්ගෙන් සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ලබා ගත් භාණ්ඩ හෝ සේවාවන් සඳහා ගෙවීමට ඇති බැරකමය.වෙළඳ ගෙවියයුතු දෑ සාමාන්‍ය ව්‍යාපාරිකමෙහෙයුම් චක්‍රය තුළ (වසරක් හෝ ඊට අඩු කාලයක් තුළ) ගෙවිය යුතු වන්නේ නම්, ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කෙරේ. එසේ නොවන අවස්ථාවකදී, ඒවා ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කෙරේ.

වෙළඳ ගෙවියයුතු දෑ මූලිකව සාධාරණ අගයට (ගණුදෙනු කරන මිල) හඳුනාගනු ලබන අතර, ඒවා පසුකාලීනව සාමාන්‍ය ව්‍යාපාරික මෙහෙයුම් චක්‍රය තුළ ගෙවීමට අදහස් කරන බැවින්, ගණුදෙනු කරන මිලට ගණනය කරනුලැබේ.

2.15 ණයගැනීම්

ණයගැනීම් සාධාරණ අගය එනම්, දරන ලද ශුද්ධ ගණුදෙනු පිරිවැය මත මූලිකව හඳුනා ගැනේ. සඵල පොලී ක්‍රමය භාවිත කරමින් ණය ගැනීම් පසුව ක්‍රමක්ෂය පිරිවැය යටතේ සිදු කෙරේ. පාවෙන අනුපාතික ණය ගැනීම් එම කාලපරිච්ඡේදය තුළ පවතින පාවෙන පොලී අනුපාතිකය (සඵල පොලී අනුපාතිකය) භාවිත කරමින් ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ එක් එක් පසු කාලසීමාව තුළ මනිනු ලැබේ. නෛතික සහ ලේඛන ගාස්තු ණය ගැනීම්වල ගණුදෙනු පිරිවැය ලෙස හඳුනා ගැනේ.

2.16 ණය ගැනීම් පිරිවැය

ණයගැනීමේ පිරිවැය ඒවාදරනු ලබන කාල සීමාව තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

2.17රජයේ ප්‍රදාන

ප්‍රදාන ලැබෙන බවට හා අරමුදල කොන්දේසි සියල්ල සපුරාලන බවට සැලකිය යුතු සහතිකයක් ඇති අවස්ථාවක රජයෙන් ලැබෙන ප්‍රදාන ඒවායේ සාධාරන අගයට හඳුනා ගැනේ.

වන්දි පූර්ණය කිරිමට සිදු වන ආනයන පිරිවැයට අදාළ පොහොර සහනාධාර විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ. සහනාධාර ලැබෙන බවට ප්‍රමාණවත්සහතිකයක් ලබා දී ඇති දැනටමත් වියදම් කර ඇති ආනයන පිරිවැය සඳහා හානි පූර්ණය කළ යුතු පොහොර සහනාධාර ලැබීමට නියමිත සහනාධාර ලෙස හඳුනාගෙන ඇත.

දේපල, පිරියත හා උපකරණවලට අදාළ රාජ්‍ය ප්‍රදාන විලම්බිත රාජ්‍ය ප්‍රදාන ලෙස ජංගම නොවන වගකීම්වලට ඇතුළත් කර ඇති අතර, සරල රේඛීය පදනම මත අදාළ වත්කම්වල අපේක්ෂිත ආයු කාලය අනුව විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගෙන ඇත.

මූල්‍යමය නොවන ප්‍රදාන මූල්‍යමය නොවන ධාරණ අගය ධාරණ අගයේ ප්‍රදාන හා වත්කම් යන දෙකම සළකා ගණනය කෙරේ.

2.18 ප්‍රවර්තන හා විලම්භිත බදු

අදාළ කාල සීමාව සඳහා බදු වියදම තුළ ප්‍රවර්තන හා විලම්බිත බදු ඇතුළත්වේ. වෙනත් විස්තීර්ණ ආදායම්වල හඳුනාගෙන ඇති අයිතම හැර විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ බදු හඳුනාගෙන ඇත. මෙහිදී, වෙනත් විස්තීර්ණ ආදායමෙහි බදු හඳුනා ගැනීමක් කර ඇත. සත්‍ය බදු අය කිරීම් දක්වා සිටින කාලයේ අරමුදල විසින් අනුගමනය කරන හා උපයන බදු ආදායමට අදාල බදු නීති අනුව ගණනය කෙරේ. වත්මන් ආදායම් බදු ගාස්තුව ගණනය කරනු ලබන්නේ අරමුදලේ ක්‍රියාකාරීත්වය සහ බදු අය කළ හැකි ආදායමක් උත්පාදනය කිරීම සඳහා අදාළ වන වාර්තාකරණ කාල සීමාව අවසානයේ පනවන ලද බදු නීති මත පදනම්වය. බදු බලධාරීන්ට ගෙවීමට අපේක්ෂා කරන මුදලේ වර්ගය අනුව සුදුසු පරිදි කළමනාකාරීත්වය විසින් ප්‍රතිපාදන වෙන් කෙරේ.

වත්කම් හා වගකීම්වල බදු පදනම් අතර, ඇති වන තාවකාලික වෙනස්කම් මත හා මූල්‍ය ප්‍රකාශවල ධාරණ අගයන් අනුව විලම්බිත බදු හඳුනා ගැනේ. ගිණුම්වලට හෝ බදුමය ලාභයට හෝ පාඩුවට අදාළ නොවන ව්‍යාපාරික සම්බන්ධයක් නොවන ගණුදෙනුවක් නිසා වන වත්කමක හෝ වගකීමක මුලික හඳුනා ගැනීමෙන් ඇති වන්නේනම් විලම්බිත බදු නොසළකා හැරේ. එහි දක්වා සිටින කාලයේ අවසන් දිනයට බලාත්මක බදු අනුපාත මත විලම්බිත බදු තීරණය කරන අතර, අදාළ විලම්බිත බදු වත්කම අත්කර ගත් පසු හෝ විලම්බිත ආදායම් බදු වගකීම පියවා ඇති අවස්ථාවක අදාල කර ගැනීමට අදහස් කෙරේ.

විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලබන්නේ තාවකාලික වෙනස්කම් භාවිත කළ හැකි අනාගත බදු අය කළ හැකි ලාභය ලබා ගත හැකි ප්‍රමාණයට පමණි.

ප්‍රවර්තන බදු වත්කම් ප්‍රවර්තන බදු වගකීම්වලට හිලව් කිරීමට නීතිමය බලය පවරන හිමිකමක් ඇති අවස්ථාවක හා එකම බදු ආයතනය විසින් පනවනු ලබන ආදායම් බදුවලට අදාල විලම්භිත බදු වත්කම් හා වගකීම් ඇති අවස්ථාවක විලම්බිත බදු වත්කම් හා වගකීම් හිලවු කරනු ලැබේ.

2.19 සේවක ප්‍රතිලාභ

අරමුදල සතුව නිශ්චිත ප්‍රතිලාභ හා නිශ්චිත දායකත්ව සැළසුම් යන දෙකම පවති.

(අ) නිශ්චිත දායකත්ව සැළැස්ම

නිශ්චිත දායකත්ව සැළැස්මක් යනු අරමුදල විසින් වෙනම ආයතනයක් වෙත ස්ථාවර දායක මුදල් ගෙවනු ලබන පශ්චාත්-රැකියා ප්‍රතිලාභ සැළැස්මකි. තවදුරටත් දායක මුදල් ගෙවීම සඳහා අරමුදලට කිසිදු නෛතික හෝ සාධනීය බැඳීම් නොමැත. දායක මුදල් ගෙවිය යුතු විට ඒවා සේවක ප්‍රතිලාභ වියදම් ලෙස හඳුනා ගැනේ.

අරමුදල මඟින් සේවක අර්ථසාධක අරමුදලට කර්මාන්තශාලා සේවකයන් සඳහා ද පාරිශ්‍රමිකවලින් 12% ක දායකත්වයක් හා වෙනත් සේවකයන් සඳහා 15% ක දායකත්වයක් ලබාදෙන අතර, සේවක භාරකාර අරමුදල සඳහා සේවකයාගේ දල පාරිශ්‍රමිකවලින් 3% ක දායකත්වයක් ලබාදේ.

(ආ) නිශ්චිතප්‍රතිලාභ සැළැස්ම

නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් සම්බන්ධයෙන් අරමුදල් බැඳීම යනු වාර්තාකරණ කාල සීමාව අවසානයේ වූ නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකමයි. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම වාර්ෂිකව මනිනු ලබන්නේ පාරිතෝෂිත සූත්‍රය භාවිත කර ගණනය කරන ලද අපේක්ෂිත ඒකක ණය ක්‍රමය භාවිත කරමිනි. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල සත්‍ය වටිනාකම සේවකයන් හා පෙර කාල සීමාවලදී තම සේවා සැපයීම මඟින් උපයන ලද ඇස්තමේන්තු කළ ඉදිරි ප්‍රතිලාභ සඳහා වට්ටම් කිරීමෙන් නිශ්චය කරනු ලැබේ.

උපකල්පනවල වෙනස්වීම්, වත්මන් සේවා පිරිවැය සහ පොලී වෙනස්වීම්වලින් පැන නඟින ලාභ සහ අලාභ ඒවා පැන නඟින කාල සීමාව තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම සඳහා බාහිරව අරමුදල් සපයන්නේ නැත.

(ඇ) කෙටිකාලීන සේවක ප්‍රතිලාභ

කෙටි කාලීන සේවක ප්‍රතිලාභ වගකීම් මනිනු ලබන්නේ සේවකයින් විසින් සපයනු ලබන අදාළ සේවාවන් සඳහා ගෙවීමට අපේක්ෂා කරන වට්ටම් රහිත මුදලක් මත ය.

2.20 ප්‍රතිපාදන හා අසම්භාව්‍ය බැරකම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස අරමුදලට වර්තමාන නෛතික හෝ සාධනීය වගකීමක් ඇති විට නීත්‍යානුකූල හිමිකම් සහ අනෙකුත් මෙහෙයුම් වියදම් සඳහා වන ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ, අරමුදලෙන් ආර්ථික සම්පත් පිටතට ගලා යාමක් අවශ්‍ය වන අතර, ප්‍රමාණයන් විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකිය.

ශේෂ පත්‍ර දිනය වන විට විභාග වෙමින් පවතින නීතිමය නඩුවල තත්ත්වය වන්නේ තේ ශක්ති අරමුදල විවිධ පාර්ශ්වවලට එරෙහිව නඩු 14ක් පවරා ඇති අතර, ඉන් නඩු 2ක් තේ ශක්තිට පක්ෂව ලබා දී තිබීමයි. පාර්ශව 12ක් තේ ශක්තියට එරෙහිව නඩු පවරා තිබූ අතර, එහි ප්‍රතිඵලය ශේෂ පත්‍ර දිනයේදී සාධාරණ ලෙස තහවුරු කර ගත නොහැකි විය.

වර්තමාන බැඳීම හා සම්බන්ධ අවදානම් සහ අවිනිශ්චිතතාවයන් ඇතුළුව, වාර්තා කරන දිනයේ පවතින වඩාත්ම විශ්වාසදායක සාක්ෂි මත පදනම්ව, වර්තමාන වගකීම පියවීමට අවශ්‍ය ඇස්තමේන්තුගත වියදම් මත ප්‍රතිපාදන මනිනු ලැබේ.

සම්පත් පිටතට ගලා යාමේ හැකියාව දුරස්ථ නොවේ නම් මිස සියලු අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශ සඳහා සටහනක් ලෙස අනාවරණය කරනු ලැබේ.

2.21 ආදායම් හඳුනාගැනීම

සාධාරණ අගයට ආදායම ගණනය කරනු ලැබේ. ආදායම ලත් හෝ ලැබීමට ඇති මිලෙහි සාධාරණ අගයට ගණනය කරනු ලබන අතර, ශුද්ධ වටිනාකම් එකතුකළ බදු (VAT) හා ජාතික ගොඩනැගීමේ බද්දෙහි (NBT) සඳහන් අරමුදලේ ක්‍රියාකාරකම්වලදී භාණ්ඩ අලෙවියෙන් ලැබෙන මුදල දැක්වේ. ආදායම් මුදල විශ්වාසදායිව මැණිය හැකි අවස්ථාවක හා ඉදිරි ආර්ථික ප්‍රතිලාභ අරමුදලට ගලා ඒමට හැකි තත්ත්වය තුළ ආදායම් ප්‍රමාණය අරමුදල හඳුනා ගනී.

එක් එක් හඳුනාගත හැකි ප්‍රධාන ආදායම් මාර්ග සඳහා අරමුදල පහත දක්වා ඇති ආදායම් හඳුනා ගැනීමේ නිර්ණායක අදාළ කරයි.

(අ)භාණ්ඩ අලෙවිය

භාණ්ඩ අලෙවියෙන් ලැබෙන ආදායම හඳුනාගනු ලබන්නේ, භාණ්ඩවල අවදානම් සහ ප්‍රතිලාභ ගැණුම්කරු වෙත ලැබී ඇති අවස්ථාවේදී, එනම් ගබඩාවලින් භාණ්ඩ ලබා දෙන අවස්ථාවේදීය.

(ආ)තේ තැරැව්කරුවන්ට අලෙවි කිරීම්
තේ තැරැව්කරුවන් හරහා සිදු කළ තේ අලෙවිය මඟින් ලත් ආදායම වෙළඳ පොළේදී තේ තැරැව්කරුවන් පාරිභෝගිකයාට විකුණා හාරදුන් භාණ්ඩවල අවදානම් හා ප්‍රතිලාභ මත හඳුනාගෙන ඇත. තේ තැරැව්කරුවන්ට විකිණීමෙන් ලත් ආදායම ඉන්වොයිස් වටිනාකමට තැරැව් ගාස්තු, අලෙවි වියදම් හා බදුවල ශුද්ධ අගයට සටහන් කෙරේ.

(ඇ)පොලි ආදායම
සඵල පොලී ක්‍රමවේදය යොදාගනිමින් පොලි ආදායම් හඳුනා ගෙන ඇත.

(ඈ)දේපල, පිරියත හා උපකරණ අපහරණයෙන් ලදලාභසහ අලාභ
අපහරණය මඟින් ඇතිවන ලාභසහ අලාභ නිශ්චය කරනු ලබන්නේ එයින් උපයන ලද මුදල ධාරණ අගය සමඟ සන්සන්දනය කිරීමෙන් වන අතර, එය විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනු ලැබේ.

(ඉ)වෙනත්ආදායම්
උපචිත පදනම මත වෙනත් ආදායම් හඳුනා ගෙන ඇත.

2.22 වියදම්
මෙහෙයුම් සිදු කිරීමේදී වන වියදම් අදාළ කාලසීමාව තුළ ලාභය ඉපයීම සඳහා වන ආදායමයි.

2.23 වාර්තාකරණ කාලසීමාවට පසුව සිදුවන සිදුවීම්
මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත්කරන කාල සීමාවට පසුව සිදු වූ ද්‍රව්‍යාත්මක සිදුවීම් සියල්ල කෙරේ අවධානය යොමු කර සුදුසු ගැලපීම් හෝ හෙලිදරවු කිරීම් මූල්‍ය ප්‍රකාශවල අදාල සටහන්වල සිදු කර ඇත.

2.24 බැඳීම්
වාර්තාකරණ කාල සීමාව අවසානයේදී පැවති ද්‍රව්‍යාත්මක බැඳීම් සියල්ල හඳුනාගෙන ඇති අතර, මූල්‍ය ප්‍රකාශවල සටහන් මඟින් දක්වා ඇත.

3. නිකුත්කර ඇති එහෙත් මෙතෙක්ක්‍රියාත්මක නොවනශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති /ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති **(SLFRS/LKAS)**
මූල්‍ය ප්‍රකාශ නිකුත් කරන දිනය වන විට නිකුත් කර ඇති එහෙත් මෙතෙක් ක්‍රියාත්මක නොවන ප්‍රමිති පහත දක්වා ඇත. ඒවා බලාත්මක වන අවස්ථාව වනවිට එම ප්‍රමිති අනුගමනය කිරීමට අරමුදල බලාපොරොත්තු වේ.

අ)**ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති** 9- **මූල්ය ලියවිලි**:LKAS39 වෙනුවට SLFRS 9 නිකුත් කර ඇති අතර, එහි දක්වා ඇති මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හඳුනා ගැනීම, වර්ගීකරණය හා තක්සේරු කිරීමට අදාළ වේ. 2015 ජනවාරි 01 දිනෙන් හෝ ඊට පසුව ඇති වාර්ෂික කාලසීමාවන් සඳහා මෙම ප්‍රමිතිය අදාළ වේ.

ආ)**ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති** 13-**සාධාරණ වටිනාකම් මිනුම**:සාධාරණ වටිනාකම් මැනීම් හා හෙලිදරවු කිරීම් සියල්ල සඳහා මාර්ගෝපදේශ SLFRS 13 තුළ ඇත. මෙම ප්‍රමිතිය මඟින් මූල්‍ය තත්ත්වය හා කාර්ය සාධනය කෙරේ ඇති කරවිය හැකි බලපෑම මේ වන විට අරමුදල තක්සේරු කරමින් සිටී. 2014 ජනවාරි 01 දිනෙන් හෝ ඊට පසුව ඇති වාර්ෂික කාල සීමාවන් සඳහා මෙම ප්‍රමිතිය අදාළ වේ.

4. විශේෂ ගිණුම්කරණ ඇස්තමේන්තු හා විනිශ්චයන්
මූල්‍ය ප්‍රකාශ සැකසීමේ දී කළමණාකරිත්වය විසින් වත්කම්, වගකීම්, ආදායම හා වියදම් හඳුනාගැනීම හා මිනුම පිළිබඳව විනිශ්චයන්, ඇස්මේන්තු හා උපකල්පනයන් සිදු කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ කෙරෙහි වඩාත් විශේෂී ලෙස බලපාන ගිනුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේදී ගනු ලබන විශේෂ විනිශ්චයන් පහත දක්වා ඇත.

(අ) විලම්බිත බදු වත්කම් හඳුනාගැනීම

හඳුනා ගත හැකි විලම්හිත බදු වත්කම් වල ප්‍රමාණය විලම්හිත බදු ආදායම භාවිත කළ හැකි ඉදිරි බදු ආදායම් ප්‍රමාණයේ තක්සේරුව මත පදනම් වනු ඇත.

වත්කම්, වගකීම්, ආදායම සහ වියදම් හඳුනා ගැනීම හා මැනීම කෙරෙහි වඩාත්ම වැදගත් බලපෑමක් ඇති ඇස්තමේන්තු සහ උපකල්පන පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(ආ) ක්ෂයවිය හැකි වත්කම්වල ඵලදායී ආයුකාලය

ක්ෂයවිය හැකි වත්කම් වල ඵලදායී ආයු කාලයේ තක්සේරුව කළමනාකාරිත්වය විසින් දන්වා සිටින දිනට වත්කම්වල අපේක්ෂිත ආර්ථික උපයෝගිතාවය මත පදනම්ව විමසුමට ලක් කරයි. මෙම ඇස්තමේන්තු වල ඇති අනියතතාවයන් ඇතැම් මෘදුකාංග හා තොරතුරු තාක්ෂණ උපකරණ භාවිතා කිරීම වෙනස් කිරීමට හේතු විය හැකි තාක්ෂණ හැකියාවට අදාළ වේ.

(ඇ) නිශ්චිත ප්‍රතිලාභ සැළසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් බැඳීම් වල සත්‍ය වටිනාකම උපකල්පන රැසක් භාව කරමින් යෝජිත ඒකක ණය පදනම මත රඳා පවතින කරුණු රැසක් මත තීරණය වේ. ශුද්ධ පිරිවැය හා වට්ටම් අනුපාතය ඇතුළුව නිශ්චිත ප්‍රතිලාභ සැළැස්ම සඳහා වන බැඳීම 26 වන සටහනෙහි දක්වා ඇත. මෙම උපකල්පනවල කිසියම් වෙනසක් ඇතිවීම නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල ධාරණ අගයට බලපෑමක් සිදු කෙරෙනු ඇත.

5. SLFRS/LKAS ප්‍රථම වරට යොදා ගැනීම

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වාර්තාකරණ කාලසීමාව සඳහා වූ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs) අනුකූලව ප්‍රථම වරට සැකසූ මූල්‍ය ප්‍රකාශ වේ. 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වාර්තාකරණ කාලසීමාව ඇතුළු පෙර වාර්තාකරණ කාල සීමාවන්දක්වා කාලයන්ට අදාළව අරමුදල තම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව 2011 දෙසැම්බර් 31 දක්වා වන තෙක් සකස් කරන ලදී.

මෙම මූල්‍ය ප්‍රකාශ සැකසීමේ දී, ආරම්භක මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs) මාරුවන දිනය වන 2011 ජනවාරි 1 දිනට සකස් කරන ලදී. මෙම සටහන මඟින් 2011 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වන කාල සීමාව සඳහා ශ්‍රීලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අදාළ මූල්‍ය ප්‍රකාශ සිදු කළ ප්‍රධාන ගැලපුම් පැහැදිලිව දැක්වේ. මෙම සටහන මඟින් 2011 ජනවාරි 01 සිට 2011 දෙසැම්බර් 31 දක්වා වන කාල සීමාව සඳහා ශ්‍රීලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLAS)මූල්‍ය ප්‍රකාශවල සිට SLFRS මූල්‍ය ප්‍රකාශ දක්වාසිදු කරන ලද ප්‍රධාන ගැලපුම් පැහැදිලිව දැක්වේ.

5.1 අතීතානුයෝගී යෙදුම මඟින් විකල්පමය නිදහස් කිරීම්

1.ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs) අනුකූලව පළමු මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, අනෙකුත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල (SLFRSs) අතීතානුයෝගී යෙදුමෙන් පහත විකල්ප නිදහස් කිරීම් අයදුම් කිරීමට අරමුදල තෝරාගෙන ඇත.

අ. සාධාරණ අගය හෝ කල්පිත පිරිවැය ලෙස ප්‍රත්‍යාගණනය

2011 දෙසැම්බර් 31 දිනට පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවසකස් කරන ලදමූල්‍ය තත්ත්වය ප්‍රකාශය තුළ දේපල, පිරියත හා උපකරණ සහ ආයෝජන දේපලවල ප්‍රත්‍යාගණන මිලට දක්වා ඇත. ප්‍රත්‍යාගණනදිනට සාධාරණ වටිනාකමට බොහෝ සේ සැසඳෙන බැවින් එම ප්‍රත්‍යාගණනමුදල ප්‍රත්‍යාගණනය කළ දිනට කල්පිත පිරිවැයක් ලෙස අරමුදල සළකනු ලැබේ.

2. පහත දැක්වෙන විකල්පව්‍යාතිරේක ගිණුම් ප්‍රමිතින්තේ ශක්ති අරමුදලගිණුම්සකස්කිරීමට අදාළ නොවේ:

අ. SLFRS 4 -මෙම යෙදවුම අරමුදල් වලට අදාළ නොවන බැවින්රක්ෂණ ගිවිසුම්

ආ. IFRIC 4 - කල්බදු අඩංගු ව තිබෙදැයි තීරණය කිරීම - අරමුදල සතුව එවැනි සැකසීමක් නොමැති බැවිනි

ඇ. LKAS 19 - සූත්‍ර ක්‍රමය භාවිතකර අරමුදල තම නිශ්චිත ප්‍රතිලාභ වගකීම් පිළියෙල කරන බැවින්, සේවක ප්‍රතිලාභ

ඈ. LKAS 21 -අරමුදල සතුව විදේශ මෙහෙයුම් නොමැති බැවින් සමුච්චිත පරිවර්තන විනිමය විචල්‍යතා

ඉ. LKAS 27-අරමුදල සතුව සමූහ ආයතන නොමැති බැවින්, අනුබද්ධිත ආයතන, හවුල් පාලන ආයතන හා සංගම්වල ආයෝජන

ඊ. අරමුදල සතුව සමූහ ආයතන නොමැති බැවින්, අනුබද්ධිත ආයතන, සංගම් හාහවුල් ව්‍යාපාරවල වත්කම් හා බැරකම්

උ. LKAS 32 - සංකීර්ණ මූල්‍ය උපකරණ අරමුදල සතුව නොමැති බැවින්, සංකීර්ණ මූල්‍ය උපකරණ

ඌ. LKAS 39 -පෙර වාර්තාකරණ කාල පරිච්ඡේදය තුළ අරමුදලට AFS සහ FVTPL මූල්‍ය උපකරණ නොමැති බැවින්, පෙර හඳුනාගත් මූල්‍ය උපකරණ නම් කිරීම

එ. දේපල, පිරියත සහ උපකරණ සම්බන්ධව ඉවත් කිරීමේ වගකීම් අරමුදලට නොමැති බැවින්, ඉවත් කිරීමේ වගකීම් දේපල, පිරියත සහ උපකරණවල පිරිවැයට ඇතුළත් කර ඇත.

ඒ. IFRIC 12 - සේවා සහන වැඩපිළිවෙළ - එවැනි වැඩපිළිවෙළක් අරමුදල සතුව නොමැති බැවිනි

5.2 අතීතානුයෝගීයෙදුම මගින් අනුගම්‍ය ව්‍යාතිරේකයන්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs)අනුකූලව ප්‍රථම මූල්‍ය ප්‍රකාශ සැකසීමේ දී, අනෙකුත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල (SLFRS) අතීතානුයෝගී යෙදුමෙන් පහත සඳහන් අනිවාර්ය ව්‍යතිරේක යෙදීමට අරමුදල බලාපොරොත්තු වේ.

1. ගිණුම්කරණ ඇස්තමේන්තු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRSs) මාරු වීමේ දිනය වන විට හා 2011 දෙසැම්බර් 31 දිනට වන සියළු ගිණුම්කරණ ඇස්තමේන්තු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ඇස්තමේන්තුවලට අනුව සකසා ඇත.

2. පහත දැක්වෙන අනුගම්‍ය ව්‍යාතිරේකයන් අරමුදලට අදාළ නොවේ:

අ. මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හඳුනා නොගැනීම

ආ. හෙජ් ගිණුම්කරණය (Hedge Accounting)

ඇ. පාලනය නොවන පොලී

5.3 SLFRSs වෙත මාරුවීම පිළිබඳව පැහැදිලි කිරීම

2 සිට 4 දක්වා වන සටහන්වල දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වාර්තාකරණ කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශ මෙන්ම 2011 දෙසැම්බර් 31 අවසන් වන වාර්තාකරණ කාලපරිච්ඡේදය සඳහා සංසන්දනාත්මක තොරතුරු සැකසීමේ දී හා SLFRSවලට මාරු වීමේ දිනය වන 2011 ජනවාරි 1 දිනට SLFRS ප්‍රකාශය ඇරඹීමේ දී යොදා ගෙන ඇත.

SLFRS සැකසීමේ දී, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව අවශ්‍ය කරන ගැලපීම් පෙර දක්වා සිටින කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශවල සිදු කර ඇත. SLAS සිට SLFRS දක්වා මාරුවීමේ ඵලයන් සම කොටස් සැසඳුම් ප්‍රකාශයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හා ගැලපුම් සටහන්වල දක්වා ඇත.

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්	2015	2014
6 ආදායම		
තේ අලෙවිය	525,348,607	556,475,091
දේශීය තේ අලෙවිය	28,146,840	28,607,143
කසල තේ අලෙවිය	5,426,424	5,626,443
පොහොර අලෙවිය	14,872,520	31,277,680
අමු ද්‍රව්‍ය සෘජු අලෙවිය	2,357	326,302
පොහොර අලෙවි වට්ටම	(277,485)	(722,985)
	573,519,262	**621,589,674**
7 වෙනත් ආදායම්		
සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ - යටිතුවර බැරකම් ලියා හැරීම්	350,024	
සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ - හිනිදුම බැරකම් ලියා හැරීම්	816,713	
තේ ක්ෂේත්‍ර ආදායම	10,188,324	11,327,571
ප්‍ර/කා ගාස්තු (කර්මාන්තශාලා)	31,169,380	30,072,600
කුලී ආදායම		1,208,010
විවිධ ආදායම්	1,320,400	1,476,879
	43,844,841	**44,085,060**
8 ශුද්ධ මූල්‍ය පිරිවැය		
පොලී ආදායම		
ස්ථාවර තැන්පතු පොලිය	394,908.78	6,617,864
	394,908.78	**6,617,864**
පොලී වියදම්		
බැංකු ණය පොලිය	20,468,018	16,704,848
	20,468,018	**16,704,848**
	20,073,109	**10,086,984**

9 බදු පෙර ලාභය

පහත සඳහන් දෑ ඇතුළුව සියළු වියදම් අය කිරීමෙන් පසුව බදු පෙර ලාභය සැකසේ.

විගණකවරුන්ගේ පාරිශ්‍රමික
ක්ෂය වීම්
ස්ථීර ප්‍රතිලාභ සැළසුම් පිරිවැය - විශ්‍රාම පාරිතෝෂිතය
කාර්ය මණ්ඩල පිරිවැය

10 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ 16 වන වගන්තිය යටතේ 2006 /04/ 1 දින සිට වසර පහක කාලයක් දක්වා අරමුදල බදු වලින් නිදහස් කර ඇති අතර එම නිදහස් කිරීම 2011 වසරේ දී අවසන්විය. මේ වන විට අරමුදල බදු බැරකම් තත්ත්වය දේශීය ආදායම් පනතට අනුව තක්සේරු කරමින් සිටී. එහි ප්‍රතිඵලයක් ලෙස නිදහස් කළ කාල සීමාව සඳහා කිසිදු ප්‍රතිපාදන සැළසීමක් සිදු කර නොමැත.

11 කොටසක මූලික ඉපයීම / (අලාභය) (රු.)		
ලවය ලෙස භාවිත කළ මුදල		
සාමාන්‍ය කොටස් හිමියන්ට ලැබිය යුතු ශුද්ධ ලාභය (රු.)	(39,232,292)	(127,823,734)
හරය ලෙස භාවිත කළ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව		
නිකුත් කරන ලද සාමාන්‍ය බර තැබූ කොටස් ප්‍රමාණය (සංඛ්‍යාව)	20,601,415	20,601,415
කොටසක මූලික ඉපයීම් (රු.)	**(1.90)**	**(6.20)**

සාමාන්‍ය කොටස් හිමියන්ට වාර්තාකරණ කාලය තුලදී අත්විය යුතු ලාභය නිකුත් කරන ලද සාමාන්‍ය බරතැබූ කොටස් ප්‍රමාණයෙන් බෙදීමෙන් කොටසක මූලික ඉපයීම් ගණනය කෙරේ.

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දක්වයි.
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් ඉතිරිය ඉදිරියට ගෙනයන ලදී.

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

12 දේපල, පිරියත හා උපකරණ

	සින්නක්කර							බදු වත්කම්		
පිරිවැය හෝ ඇගයීම	ඉඩම් හා ගොඩනැගිලි	පිරියත හා යන්ත්‍රසූත්‍ර	මෝටර් රථ	ලීබඩු සහ සවිකුරු	පරිගණක	උපකරණ හා මෙවලම්	දුරකතන	ඉඩම් හා ගොඩනැගිලි	ලීබඩු සහ සවිකුරු	එකතුව
2014 දෙසැම්බර් 31 දිනට ශේෂය	**219,000,032**	**307,105,800**	**25,373,359**	**4,416,272**	**4,565,247**	**3,457,437**	**330,200**	**-**	**-**	**564,248,348**
එකතු කිරීම්	**13,052,055**	**20,546,250**		**228,850**		**9,000**				**33,836,155**
මාරුකිරීම්	**(16,692,535)**	**(56,009,700)**		**(191,918)**		**(119,080)**				**(73,013,233)**
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	**215,359,552**	**271,642,350**	**25,373,359**	**4,453,204**	**4,565,247**	**3,347,357**	**330,200**	**-**	**-**	**525,071,270**
ක්ෂය වෙන් කිරීම්										
2014 දෙසැම්බර් 31 දිනට ශේෂය	**33,328,920**	**174,711,697**	**22,497,119**	**3,674,868**	**2,053,179**	**2,576,012**	**271,941**			**239,113,736**
එකතු කිරීම්	**2,514,426**	**11,424,955**		**111,768**		**7,725**				**14,058,874**
මාරුකිරීම්	**(3,506,250)**	**(35,157,573)**		**(163,131)**		**(95,879)**				**(38,922,833)**
වසරේ අයකිරීම්	**4,105,748**	**20,226,444**	**1,923,740**	**265,864**	**428,437**	**228,783**	**34,694**			**27,213,710**
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	**36,442,844**	**171,205,523**	**24,420,859**	**3,889,369**	**2,481,616**	**2,716,641**	**306,635**	**-**	**-**	**241,463,487**

ශුද්ධ ධාරණ අගයන්	2015	2014
සින්නක්කර වත්කම්		
ඉඩම් හා ගොඩනැගිලි	**178,916,708**	185,671,112
ගොඩනැගිලි		
පිරියත හා යන්ත්‍රසූත්‍ර	**100,436,827**	132,394,103
මෝටර් රථ	**952,500**	2,876,240
ලීබඩු සහ සවිකුරු	**563,835**	741,404
පරිගනක	**2,083,631**	2,512,068
උපකරණ හා මෙවලම්	**630,716**	881,425
දුරකථන	**23,565**	58,259
	283,607,783	**325,134,612**
කෙරීගෙන යන නොනිමි වැඩ	**1,653,830**	5,641,342.28
	285,261,613	**330,775,955**

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දක්වයි.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් ඉතිරිය ඉදිරියට ගෙනයන ලදී.

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්	2015	2014
12.1 නොනිමි ප්‍රාග්ධන කාර්යයන් (ගොඩනැගිලි/ පිරියත සහ යන්ත්‍රසූත්‍ර)		
ජනවාරි 01 දිනට ශේෂය	**5,641,342**	**3,945,664**
එකතු කිරීම් / (ප්‍රාග්ධනායිත)		1,695,678
ආයෝජන දේපල වෙත මාරුකිරීම	(3,987,512)	
දෙසැම්බර් 31 දිනට ශේෂය	**1,653,830**	**5,641,342**
13 අස්පෘශ්‍ය වත්කම්		
පරිගණක මෘදුකාංග		
පිරිවැය		
ජනවාරි 01 දිනට ශේෂය	**2,435,000**	**2,435,000**
එකතු කිරීම් / (අපහරණයන්)	165,000	
දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,600,000**	**2,435,000**
ශුද්ධ ධාරණ අගය	**2,600,000**	**2,435,000**
14 ආයෝජන දේපල		
පිරිවැය		
ඉඩම් සහ ගොඩනැගිල්ල		
ජනවාරි 01 දිනට ශේෂය	**12,225,000**	**12,225,000**
එකතු කිරීම්	827,055	
ඝින්නක්කර වත්කම් වෙත මාරු කිරීම	(13,052,055)	
ඝින්නක්කර වත්කම් වලින් මාරු කිරීම	16,692,535	
දෙසැම්බර් 31 දිනට ශේෂය	**16,692,535**	**12,225,000**
පිරියත / යන්ත්‍රසූත්‍ර සහ වෙනත්		
ජනවාරි 01 දිනට ශේෂය	**17,274,250**	**17,274,250**
එකතු කිරීම්	3,509,850	
ඝින්නක්කර වත්කම් වෙත මාරු කිරීම	(20,784,100)	
ඝින්නක්කර වත්කම් වලින් මාරු කිරීම	56,320,698	
දෙසැම්බර් 31 දිනට ශේෂය	**56,320,698**	**17,274,250**
ක්ෂය වෙන් කිරීම්		
ජනවාරි 01 දිනට ශේෂය	**13,484,614**	**11,898,187**
එකතු කිරීම්	574,260	
ඝින්නක්කර වත්කම් වෙත මාරු කිරීම	(14,058,874)	
ඝින්නක්කර වත්කම් වලින් මාරු කිරීම	38,922,833	
වසරේ අයකිරීම්	4,644,327	1,586,427
දෙසැම්බර් 31 දිනට ශේෂය	**43,567,160**	**13,484,614**
ශුද්ධ පොත් වටිනාකම		
ඉඩම් හා ගොඩනැගිලි	**12,773,785**	**9,044,688**
පිරියත / යන්ත්‍රසූත්‍ර සහ වෙනත්	16,672,288	6,969,948
කෙරිගෙන යන නොනිමි වැඩ	3,987,512	
	33,433,585	**16,014,636**
15 පරිනත / අපරිනත වගා		
පරිනත වගාව (තේ)		
පිරිවැය		
ජනවාරි 01 දිනට ශේෂය	**7,319,420**	**4,749,958**
එකතු කිරීම්/ (අපහරණ)	2,682,599	2,569,462
දෙසැම්බර් 31 දිනට ශේෂය	**10,002,019**	**7,319,420**
ක්‍රමක්ෂය		
ජනවාරි 01 දිනට ශේෂය	**1,699,813**	**1,107,563**
වසරේ අයකිරීම්	860,510	592,250
දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,560,323**	**1,699,813**
ශුද්ධ පොත් වටිනාකම	**7,441,696**	**5,619,607**
අපරිනත වගාව (තේ)		
පිරිවැය		
ජනවාරි 01 දිනට ශේෂය	**7,808,301**	**8,174,111**
එකතු කිරීම්	1,590,656	2,203,652
මාරු කිරීම්	(2,682,599)	(2,569,462)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**6,716,358**	**7,808,301**
මූළු ශුද්ධ පොත් වටිනාකම් වල එකතුව	**14,158,054**	**13,427,908**

වරහන් තුළ ඇති සංඛ්‍යා මඟින් අඩු කිරීම් දක්වයි.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් ඉතිරිය ඉදිරියට ගෙනයන ලදී.

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්		2015	2014

16 මූල්‍යනය

මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් වර්ග

මූල්‍ය තත්වය ප්‍රකාශනයේ සඳහන් මූල්‍ය වත්කම් හා බැරකම් වල ධාරණ අගය පහත දැක්වේ.

මූල්‍ය වත්කම් හා බැරකම් වල ධාරණ අගයන්

මූල්‍ය වත්කම්	**සටහන**		
ණය සහ ලැබිය යුතුදෑ			
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ	**(සටහන 18)**	282,511,012	274,665,507
මුදල් හා මුදල්වලට සමාන දෑ	**(සටහන 20)**	3,181,092	6,891,350
		285,692,104	**281,556,856**

ණය හා ලැබීමට නියමිත දෑ ඒවායේ ධාරණ අගය සාධාරණ අගයට ආසන්න බැවින් ඒවායේ ධාරණ අගයට දක්වා ඇත.

මූල්‍ය වත්කම් එකතුව		**285,692,104**	**281,556,856**
මූල්‍ය බැරකම්			
වෙනතව් මූල්‍ය බැරකම්			
ණයගැනීම්	**(සටහන 25)**	6,008,533	18,381,397
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ	**(සටහන 27)**	309,758,086	315,491,677
බැංකු අයිරා	**(සටහන 20)**	9,868,056	
		325,634,675	**333,873,074**

වෙනත් මූල්‍ය බැරකම් ඒවායේ ධාරණ අගය සාධාරණ අගයට ආසන්න වන බැවින් ඒවායේ ධාරණ අගයට දක්වා ඇත.

මූල්‍ය බැරකම් එකතුව		**325,634,675**	**333,873,074**

17 භාණ්ඩ තොග			
කර්මාන්තශාලා තේ තොග		25,743,830	42,169,446
ගඩඩා/ තැරැවිකාරවන් වෙතැති තේ තොග		36,483,610	58,554,688
අමුද්‍රව්‍ය		1,020,555	1,213,600
නිමි භාණ්ඩ		101,257	863,537
දේශීය තේ අලෙවි අංශයේ ඇති තේ තොග		1,132,852	1,982,699
සාමාන්‍ය තොග		4,885,369	8,499,035
ලිපිදුව්‍ය අයිතමයන්		27,136	183,075
පොහොර		195,984	584,851
		69,590,593	**114,050,930**
18 වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ			
වෙළඳ ලැබිය යුතු දෑ	**(සටහන 18.1)**	119,848,226	126,568,420
තැන්පතු හා අත්තිකාරම්	**(සටහන 18.2)**	40,372,471	40,322,856
වෙනත් ලැබිය යුතු දෑ	**(සටහන 18.3)**	110,676,924	96,160,834
ලැබිය යුතු සහනධාර			
පෙර ගෙවුම් වියදම්			
		270,897,621	**263,052,111**
18.1 වෙළඳ ලැබිය යුතු දෑ		131,461,617	138,181,816
හානි පාඩු සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම්		(11,613,391)	(11,613,396)
		119,848,226	**126,568,420**
18.2 තැන්පතු හා අත්තිකාරම්			
තැන්පතු		1,269,372	2,578,400
ගෙවූ අත්තිකාරම්		39,103,099	37,744,457
		40,372,471	**40,322,856**
18.3 වෙනත් ලැබිය යුතු දෑ			
ලැබිය යුතු පොලී		61,143,439	50,968,658
වෙනත්		57,274,525	52,933,216
		118,417,964	103,901,874
හානි පාඩු සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම්		(7,741,040)	(7,741,040)
		110,676,924	**96,160,834**

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දක්වයි.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් ඉතිරිය ඉදිරියට ගෙනයන ලදී.

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්		2015	2014
19	**ව්‍යවස්ථාපිත ලැබිය යුතු දෑ**		
	ආර්ථික සේවා ගාස්තු (ESC)	2,790,822	3,415,813
	ප්‍රවර්තන බදු		
	අගය එකතු කළ බදු		
		2,790,822	**3,415,813**
20	**මුදල් හා මුදල්වලට සමාන දෑ**		
	වාසිදායක ශේෂ		
	අතැනි මුදල්	36,936	206,577
	බැංකුගත මුදල්	3,144,156	6,684,772
		3,181,092	**6,891,350**
	අවාසිදායක ශේෂ		
	බැංකු අයිරා	**(13,049,148)**	
	මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාර්යය සඳහා වන මුදල් හා මුදල් වලට සමාන දෑ	**(9,868,056)**	**6,891,350**
21	**ප්‍රකාශිත ප්‍රාග්ධනය**		
	නිකුත්කළ හා සම්පූර්ණයෙන්ම ගෙවන ලද		
	සාමාන්‍ය කොටස් 20,895,913	206,014,150	206,014,150
	(-) කොටස් මිලදී ගැනීම්		
		206,014,150	**206,014,150**
22	**සාමාජිකයන්ගේ දායකත්ව අරමුදල**		
	ජනවාරි 01 දිනට ශේෂය	**135,184,750**	**135,089,150**
	වර්ෂය තුළ ලැබීම්	37,200	95,600
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**135,221,950**	**135,184,750**
23	**රජයේ ප්‍රදාන**		
	ජනවාරි 01 දිනට ශේෂය	**331,803,521**	**350,004,024**
	වර්ෂය තුළ ලැබීම්	50,000,000	25,550,000
	රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම	(119,300,503)	(43,750,503)
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**262,503,018**	**331,803,521**
24	**සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම**		
	ජනවාරි 01 දිනට ශේෂය		
	වර්ෂය තුළ ලැබීම්	50,000,000	
	සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ බැරකම් Amc ක්‍රමක්ෂය කිරීම	1,166,736	
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**48,833,264**	
25	**ණය ගැනීම්**		
	ජංගම නොවන කොටස		
	කාලීන ණය **(සටහන 25.1)**	18,381,397	13,455,505
		18,381,397	13,455,505
	ජංගම කොටස		
	කාලීන ණය **(සටහන 25.1)**	(12,372,864)	4,925,892
		(12,372,864)	4,925,892
	බැංකු අයිරා **(සටහන 20)**		
		6,008,533	**18,381,397**

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දක්වයි.
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් ඉතිරිය ඉදිරියට ගෙනයන ලදී.

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්	2015	2014

25 ණයගැනීම් ඉතිරිය.....

ස්ථාවර හා වල අනුපාත මත සිදු කළ ණයගැනීම් වල ධාරණ අගයන් පහත දක්වා ඇත.

වල අනුපාතය:

කාලීන ණය හා කෙටිකාලීන ණයගැනීම් වල ධාරණ අගයන්		
ස්ථාවර අනුපාතය		
කාලීන ණය හා කෙටිකාලීන ණයගැනීම් වල ධාරණ අගයන්	6,008,533	18,381,397
	6,008,533	**18,381,397**

25.1 කාලීන ණය

ජනවාරි 01 දිනට ශේෂය	**18,381,397**	**13,455,505**
වර්ෂය තුළදී ලබාගත් ණය		16,332,302
වර්ෂය තුළදී ආපසු ගෙවීම්	(12,372,864)	(11,406,410)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**6,008,533**	**18,381,397**
ජංගම කොටස	(12,372,864)	4,925,892
ජංගම නොවන කොටස	18,381,397	13,455,505
	6,008,533	**18,381,397**

26 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

ජනවාරි 01 දිනට ශේෂය		**26,431,382**	**20,275,222**
විස්තිරණ ආදායමෙහි හඳුනාගත් වියදම්	**(සටහන 26.1)**	5,791,088	9,418,925
වර්ෂය තුළ සිදුකළ ගෙවීම්		(3,700,585)	(3,262,765)
ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (SLFRSs) වෙත සංක්‍රාන්ති දිනට රඳවාගත් ඉපැයුම්			
දෙසැම්බර් 31 දිනට ශේෂය		**28,521,886**	**26,431,382**

26.1 විස්තිරණ ආදායමෙහි හඳුනාගත් වියදම

ප්‍රවර්තන සේවා පිරිවැය	3,474,653.08	5,651,355
වසරේ පොලී අයකිරීම	2,026,880.96	3,296,624
ගිණුම්කරණ උපකල්පන වෙනස්වීමෙන් හටගත් (ලාභ) /අලාභ	289,554.42	470,946
	5,791,088	**9,418,925**

අරමුදල මගින් ඇති කළ මෙම උපකල්පන විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම් ගණනය කිරීම සඳහා යොදන කළමනාකාරිත්වයේ විචල්‍යයන්හි තක්සේරු මත පදනම් වේ. වට්ටම් අනුපාතය දිගුකාලීන රාජ්‍ය ඇපකර වල වෙළඳපල අනුපාත පදනම මත තීරණය කෙරේ.

යොදාගත් ප්‍රධාන උපකල්පන පහත දැක්වේ.

වට්ටම් අනුපාතය [%]	10.75%	10.75%
ඉදිරි වැටුප් වැඩිවීම් - වැටුප [%]	2%	2%
කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය [%]	3%	3%
විශ්‍රාම වයස [අවු.]	55	55

27 වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ

වෙළඳගෙවිය යුතු දෑ	207,645,383	220,242,249
වෙනත් ගෙවිය යුතු දෑ	102,112,703	95,249,428
	309,758,086	**315,491,677**

28 ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ

රැඳවුම් බද්ද (WHT)	**4,545,276**	**3,599,202**
	4,545,276	**3,599,202**

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දක්වයි.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් ඉතිරිය ඉදිරියට ගෙනයන ලදී.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல. My No. } පීඑල්ඒ/බී/ටීඑස්එෆ්/01/20 මඟේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2017 මැයි 18 දින.

ලේකම්,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.

තේ ශක්ති අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

පිටපත් :-
1. ලේකම් , වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
2. ලේකම් , මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය
எனது இல.
My No. පිඑල්ඒ/බී/විඵස්එස්/01/2015

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2017 මැයි /9- දින.

ලේකම්,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.

තේ ශක්ති අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

තේ ශක්ති අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2000 අංක 47 දරන තේ ශක්ති අරමුදල් පනතේ 13(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ පැතුළුන් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අමාත්‍යාංශයේ ලේකම් වෙත 2017 ජනවාරි 10 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් පැනිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම් වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. . · இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. · No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත පැවරී ඇති බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට තේ ශක්ති අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 අරමුදල ප්‍රතිව්‍යුහගත වැඩපිළිවෙලකට යොමුවීම

පසුගිය වර්ෂ 05 ක අරමුදලේ මූල්‍ය ප්‍රතිඵල සැලකිමේදී 2012 වර්ෂයේදී හැර අනෙකුත් වර්ෂවල අබණ්ඩව අලාභ ලබා තිබුණි. 2005 වර්ෂයට පෙර අරමුදලට භාණ්ඩාගාරයෙන් ලබාදී තිබුණු එකතුව රු.මිලියන 437.5 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන 2012 වර්ෂයේ සිට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට පටහැනිව වාර්ෂිකව සියයට 10 බැගින් ආදායමට ගැලපීම නිසා අලාභ තත්ත්වය අඩුවෙන් පෙන්නුම් කිරීමට හේතු වී තිබූ අතර ඉකුත් වර්ෂයේදී රු.මිලියන 25.55 ක් වූ රජයෙන් ලද ප්‍රදාන විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට ගැලපීම නිසා ඉහත අලාභ තත්ත්වය සමාලෝචිත වර්ෂයේදී තවදුරටත් අඩුවෙන් පෙන්නුම් කිරීමට හේතු වී තිබුණි. තවද කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට ගෙවිය යුතුව තිබූ රු.මිලියන 74 ක් ආදායමට ගැනීම නිසා 2012 වර්ෂයේදී ලාභදායී තත්ත්වයක් පෙන්නුම් කර තිබුණි.

2011 වර්ෂයේ දී රු.මිලියන 553.04 ක් වූ අරමුදලේ ශුද්ධ වත්කම් 2014 වර්ෂයේදී රු.මිලියන 72.42 ක ශුද්ධ වගකීම් තත්ත්වයක් බවට පත්වී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානය වනවිට එය රු.මිලියන 111.65 ක් දක්වා වැඩිවී තිබුණි. එසේම අරමුදල යතුව පැවති කම්හල්වල නිෂ්පාදන කටයුතු 2016 ජූලි වන විට නතර කර තිබුණු අතර අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙලක් කරා යොමුවී තිබුණි.

2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 10

මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමත කල දිනය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

ප්‍රත්‍යාගණන වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට තවත් ප්‍රත්‍යාගණනයක් සිදුකල යුතු නමුත් අරමුදලේ ස්ථාවර වත්කම් 2006 වසරෙන් පසුව ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදල විසින් උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණද ආයෝජන පොලී, මුදල් පදනම මත ගිණුම්ගත කර තිබූ බැවින් සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු පොලී රු.777,940 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන සටහන් අනුව තේ වගාවේ ඵලදායී ජීව කාලය වසර 33 ක් වුවත් ගිණුම් ගතකිරීමේ දී එය වසර 10 ක් ලෙස සලකා තිබුණි.

2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී අරමුදල සතු තේ වගාව සම්බන්ධයෙන් ක්‍රමක්ෂය රු.599,775 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(අ) සමාලෝචිත වර්ෂයේ යන්ත්‍ර හා සවිකිරීම් වලට හාදාල ක්ෂය රු.518,627 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) යටිනුවර තේ කර්මාන්තශාලාව බදු පදනම මත බාහිර පාර්ශවයක් වෙත ලබාදී ඇතත් එහි කර්මාන්තශාලා ඉදිකිරීම් වටිනාකම ගණනය කර ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) අරමුදල වෙත නිත්‍යානුකූල අයිතිය නොමැති වාහන 9 ක් සම්බන්ධයෙන් අරමුදල දරා තිබූ රු. 8,512,921 ක් ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනීත කර තිබුණි.

2.2.5 පැහැදිලි නොකල වෙනස්කම්

බැංකු ගිණුම් දෙකකට අදාළව බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීමේදී මුදල් පොතේ ශේෂය හා ලෙජර් ගිණුම් ශේෂය අතර එකතුව රු.96,449 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනස්කම් හඳුනාගැනීමට කටයුතුකර නොතිබුණි.

2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂය අවසානයට රු. 119,848,226 ක් වූ වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ සහ රු.34,900,729 ක් වූ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂ සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛණ හා ශේෂ සනාථන විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2001 වර්ෂයේදී බුලත්කොහුපිටිය හා පොතුපිටිය තේ කර්මාන්තශාලා ඉදිකිරීමට ලබා දී තිබූ එකතුව රු.18,042,351 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර කර්මාන්තශාලා ඉදිකිරීම්ද අතරමග නවතා දමා තිබුණි.

(ඌ) යටිනුවර තේ කර්මාන්තශාලාව කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම වෙත බදු පදනම මත පවරා දී ඇතත් 2005 වර්ෂයේදී එය ඉදිකිරීමේදී පුද්ගලික සමාගමකට ලබා දී තිබූ රු.10,269,400 ක දත්නිකාරම් ජංගම වත්කම් යටතේ නවදුරටත් දක්වා ඇති අතර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) හිනිදුම තේ කම්හල කළුබෝවිටියාන තේ සමාගම් වෙත බදු පදනම් මත පවරාදීමේදී, අරමුදලට ලැබිය යුතු රු.1,661,828 ක් අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව 2012 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ඇ) කුඩා තේ වතු සංවර්ධන අධිකාරියෙන් අරමුදලට ලබා දී තිබූ වතු සමිතිවලට අයත් වාහන 13 ක් වෙනුවෙන් රු. 2,691,324 ක් අයවිය යුතු පාර්ශවයන් හඳුනාගැනීමකින් තොරව ලැබිය යුතු ලෙස ජංගම වත්කම් යටතේ වසර ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම්
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය.	
මුදල් රෙගුලාසි 110	පාඩු හා හානි සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය II පරිච්ඡේදයේ 13.3 වගන්තිය	වැඩ බැලීමේ පත්වීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක්, උපරිමය මාස 03 ක කාලයකට වුවත්, අරමුදලේ ගණකාධිකාරි තනතුර සහ පොත් තබන්නා තනතුර සඳහා වැඩ බැලීමේ පදනම් මත නිලධාරීන් දෙදෙනෙකු පිළිවෙලින්, 2012 සහ 2010 වර්ෂයේ සිට පත්කර තිබුණි.

(ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ.

2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන චක්‍රලේඛය	පරිගණක හා මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2014 වර්ෂයේදී වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් කර්මාන්තශාලා යන්ත්‍ර නවීකරණය සඳහා ම පමණක් ලැබී තිබුණු රු.25,500,000 ක් අදාල කාර්යයට නොයොදවා සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදම් සඳහා වැයකර තිබූ නමුත් ඊට විධිමත් අධිකාරී බලයක් ලබාගෙන නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව 2015 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.39,232,292 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.127,823,734 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.88,591,442 ක එනම් සියයට 69 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ පරිපාලන වියදම් රු.11,952,188 කින් අඩුවීම සහ රජයෙන් ලද ප්‍රදාන රු.75,550,000 ක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට ගැලපීම, ඉහත වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂය හැර අනෙකුත් වර්ෂයන්හීදී මූල්‍ය ඌනතාවයක් ලබා තිබූ නමුත් සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකිල්ලට ගැනීමේදී අරමුදලේ දායකත්වය හිතකර අගයක් ගෙන තිබුණි. එහෙත් 2014 වර්ෂයේ දී දායකත්වය සැලකියයුතු මට්ටමකින් පහත වැටී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී නැවතත් එය සියයට 94 කින් වර්ධනය වී තිබුණි.

3.2 විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය සහ ක්ෂණික අනුපාතය පිළිවෙලින් 1.1 හා 0.23 ක් වූයෙන් පැවතිය යුතු ප්‍රශස්ත මට්ටමෙහි එම අනුපාතයන් නොපැවතුණි. තවද ඉකුත් වර්ෂයට සාපේක්ෂව එම අනුපාතයන්හි පිරිහීමක් නිරීක්ෂණය විය.

3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

එහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදල විසින් කළමනාකරණ කම්හල් 11 කට එරෙහිව අරමුදලට ලැබිය යුතු මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් අධිකරණවල නඩු 11 ක් ගොනුකර තිබුණු අතර අරමුදලේ අලෙවි අංශයේ රු.250,019 ක මුදල් වංචාවක් සම්බන්ධව කොළඹ දිසා අධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි.

(ආ) අරමුදලට ලැබිය යුතු රු.19,211,584 ක් ලැයකර ගැනීම සම්බන්ධයෙන් බාහිර ආයතනයකට විරුද්ධව නඩු පවරා තිබූ අතර 2014 ජූනි 20 දින අරමුදලට වාසිදායක ලෙස තීන්දුව ලබා දී පැහත් විත්තිය විසින් 2014 අගෝස්තු 20 දින කොළඹ වාණිජ මහාධිකරණයේ අභියාචනා නඩුවක් ගොනුකර තිබුණි.

(ඇ) සේවකයන් විසින් අරමුදලට එරෙහිව කම්කරු විනිශ්චය සභාවේ නඩු 8 ක් ගොනුකර තිබුණු අතර සේවකයකු විසින් දිසා අධිකරණයේ පවරන ලද නඩුවෙහි තීන්දුව අරමුදලෙහි වාසියට ලැබී ඇතත් පැමිණිලිකරු අභියාචනා නඩුවක් ගොනුකර තිබුණි.

(ඈ) අරමුදලට අයත් ඉඩම් පාර්සල් සම්බන්ධයෙන් අරමුදලට එරෙහිව දිසා අධිකරණවල නඩු 2 ක් ගොනුකර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය.

4.1 කාර්යසාධනය

2000 අංක 47 දරන ගේ ශක්ති අරමුදල පනතේ 7 වන ඡේදය ප්‍රකාරව අරමුණු සංක්ෂිප්ත වශයෙන් පහත සඳහන් පරිදි වේ.

- කුඩා තේ වතු හිමියන් තුළ ඉතිරි කිරීමේ පුරුදු ඇති කිරීම් හා ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ගේ ආර්ථික හා සමාජීය තත්ත්වය නඟා සිටුවීම සහ තේ කර්මාන්තයට අදාළ වන අවශ්‍ය ආයෝජන ප්‍රවර්ධනය කිරීම.

- තේ කර්මාන්තශාලා අත්කර ගැනීම, සංවර්ධනය කිරීම, තේ කර්මාන්තශාලාවල නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය වෙනත් පහසුකම් සැලසීම සහ කුඩා තේ වතු හිමියන්ගේ ඵලදාව නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම්.

- කුඩා තේ වතු හිමියන් වශයෙන් තේ නිෂ්පාදනයෙහි නියැලී සිටින්නවුන්ගේ මනා පැවැත්ම නඟා සිටුවීම් සඳහා අවශ්‍ය විය හැකි යම් පියවරවල් ගැනීම්.

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා අරමුදල විසින් සමාලෝචිත වර්ෂයේදී නව ක්‍රියාමාර්ග ගෙන නොනිබුණු අතර කර්මාන්තශාලා 10 ක් සහ අරමුදලේ කොටස් හිමියන්ගේ රක්ෂණ ප්‍රතිලාභ ක්‍රමය පවත්වාගෙන යාම පමණක් සිදුකර තිබුණු අතර තව දුරටත් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කම්හල් ලාභ/අලාභ

අරමුදල සතු කම්හල් 15 ක් පැවති අතර ඉන් කම්හල් 10 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරීව පැවතුණි. කම්හල් ගිණුම් අනුව සමාලෝචිත වර්ෂයේදී එම කම්හල් තුළින් ලද ලාභය රු.88,770,617 ක් වූ අතර එය පසුගිය වර්ෂය හා සැසඳීමේදී රු.26,712,320 කින් එනම් සියයට 23 කින් අඩුවී තිබුණි. 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ක්‍රියාකාරී තත්ත්වයේ පැවති කර්මාන්තශාලා ලැබූ ලාභ/ අලාභ තත්ත්වයන් පහත දැක්වේ.

කම්හල	දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයන් සඳහා				
	2015	2014	2013	2012	2011
	රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000
දෙනියාය	(11,735)	(11,913)	(7,777)	(7,349)	(4,126)
වලහන්දුව	(12,245)	(14,068)	731	(2,297)	(3,312)
මාවරල	(7,614)	(10,279)	(10,229)	(6,108)	(3,653)
ඇල්පිටිය	(14,675)	(13,482)	(3,409)	(7,990)	(16,604)
රයිගම්කෝරලය	(13,737)	(15,885)	(7,479)	(7,579)	2,191
කොත්මලේ	(8,092)	(9,683)	(6,933)	(6,132)	(8,901)
කැප්පෙටිපොල	(4,000)	(5,628)	5,421	(1,285)	(5,223)
පස්සර	(1,643)	(1,769)	5,772	6,640	2,345
මහවැලි	(4,360)	(10,054)	(13,079)	(899)	245
දැරනියගල	(10,669)	(22,722)	(8,770)	(3,989)	-
	(88,770)	(115,483)	(45,752)	(36,988)	(37,038)

කම්හල් දලාභය දවම කිරීම සඳහා වැඩි දළු ප්‍රමාණයක් මිලදී ගැනීමේ පරමුණින් තේ දළු සඳහා වැඩි මිලක් 2010 වර්ෂයේ සිට අඛණ්ඩව ගෙවා තිබුණද මෙම අරමුණ ඉටු නොවී පැවති අතර මේ සඳහා දරා තිබූ සමුච්චිත අමතර පිරිවැය රු.73,494,328 ක් විය.

(ආ) තේ නිෂ්පාදනය

තේ නිෂ්පාදනය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද තොරතුරු පහත පරිදි වේ.

කම්හල	තේ කිලෝවක නිෂ්පාදන පිරිවැය		නිෂ්පාදනය		යන්ත්‍ර ධාරිතාව (නිෂ්පාදනය මත)	නිෂ්පාදනයට උපයෝගී කරගත් තේ දල වලින් නිෂ්පාදිත ප්‍රමාණය (ප්‍රමිත ප්‍රතිශතය 21.5)	තේ කිලෝවක ශුද්ධ විකුණුම් සාමාන්‍ය
	(රු.)		(කි.ග්‍රෑ)		(කි.ග්‍රෑ)	%	(රු.)
	2014	2015	2014	2015		2015	2015
දෙනියාය	527.22	498.72	146,651	115,894	451,500	20.51	373.02
දැරණියගල	474.62	447.46	250,966	174,912	387,000	20.94	346.96
කොත්මලේ	488.36	-	80,351	4,837	451,500	-	-
පස්සර	382.53	349.31	209,097	309,379	387,000	22.57	326.68
වලහන්දුව	537.70	513.05	148,814	108,880	516,000	20.65	372.49
කැප්පෙට්ටිපොළ	391.10	360.08	206,235	270,036	387,000	21.70	324.54
මහවැලි	428.92	357.36	188,065	275,144	774,000	21.82	329.23
ඇල්පිටිය	565.26	447.96	102,435	159,632	516,000	20.04	327.52
රයිගම්කෝරලය	483.02	431.76	316,688	358,525	516,000	20.16	373.68
මාවරල	644.51	-	55,380	-	322,500	-	-

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පසුගිය වර්ෂ 3 තුළදී ඇරමුදල සතුව පැවති කම්හල් පද්ධතියේම යන්ත්‍ර ධාරිතාවය ඒහා උපයෝජිත මට්ටමක පැවති අතර සමාලෝචිත වර්ෂයේදී කම්හල් 6 ක තේ නිෂ්පාදනය ධාරිතාවෙන් සියයට 50 ට වඩා අඩුවී නිබුණු අතර කම්හල් 3 ක ධාරිතාව සියයට 80 දක්වා පමණක් උපයෝජනය කර නිබුණි. ඒ අනුව නිෂ්පාදන පිරිවැය තුළ පොදුකාර්ය පිරිවැය හේතුවෙන් තේ කිලෝවක නිෂ්පාදන පිරිවැය ඉහළ ගොස් නිබුණි.

(ii) මාවරල තේ කම්හල 2015 වර්ෂයේදී නිෂ්පාදන කටයුතු නතර කර තිබූ අතර කොත්මලේ තේ කම්හලද මාර්තු මාසයේ සිට ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතුණි. ක්‍රියාකාරී මට්ටමේ පැවති කම්හල් 8 න් ප්‍රශස්ථ තේ නිෂ්පාදන මට්ටම වන සියයට 21.5 ලහා කර ගැනීමට කම්හල් 5 ක් අසමත් වී තිබූ අතර ඒ හේතුවෙන් අමු තේ දළු මත සෘජු වියදම් ඉහල ගොස් තිබුණි.

ඉහත (i), (ii) ඡේදවල සඳහන් කම්හල්වල තේ කිලෝවක නිෂ්පාදන පිරිවැය, තේ කිලෝවක සාමාන්‍ය ශුද්ධ විකුණුම් මිල ඉක්මවා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා කාර්ය සාධන වාර්තා අනුව තේ නිෂ්පාදනය පහත පරිදි වේ.

කම්හල	ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්කගත අමු තේ දළු මිලදී ගැනීම.	තථ්‍ය තේ දළු මිලදී ගැනීම.	ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්කගත තේ නිෂ්පාදනය	තථ්‍ය තේ නිෂ්පාදනය	විචලනය ප්‍රතිශතය
	(කිලෝ ග්‍රෑම්)	(කිලෝ ග්‍රෑම්)	(කිලෝ ග්‍රෑම්)	(කිලෝ ග්‍රෑම්)	
දෙනියාය	1,200,000	565,013	258,000	115,894	55.08
වලහන්දුව	1,130,000	527,228	242,950	108,880	55.18
මාවරල	1,016,800	-	218,655	-	-
හැල්පිටිය	950,000	796,446	204,250	159,632	21.84
රයිගම්කෝරලය	1,800,000	1,778,508	387,000	358,525	7.36
දැරණියගල	1,484,650	835,151	319,200	174,912	45.20
කොත්මලේ	1,168,000	128,396	251,100	4,837	98.07
කැප්පෙට්ටිපොළ	1,395,000	1,244,335	299,925	270,036	9.96
පස්සර	1,334,500	1,370,669	287,000	309,379	(7.8)
මහවැලි	1700.000	1.261.161	365.500	275.144	24.72
එකතුව	13,178,950	8,506,907	2,833,580	1,777,239	

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව අමු තේ දළු කිලෝ ග්‍රෑම් 13,178,950 ක් මිලදී ගැනීමට අපේක්ෂා කළද මිලදී ගෙන තිබුණේ තේ දළු කිලෝ ග්‍රෑම් 8,506,907 ක් පමණක් බැවින් විචලනය සියයට 35.45 ක් විය. එබැවින් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්කගත

තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් 2,833,580 ක් වූවද තථ්‍ය නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් 1,777,239 ක් එනම් සියයට 62.72 ක් පමණක් විය. කම්හල් වශයෙන් සැලකූ විට විචලනය දෙනියාය ,වලහන්දුව, කොත්මලේ හා දැරනියගල කම්හල් වල සියයට 25 සිට සියයට 98 දක්වා වූ පරාසයක පැවතුණි.

(ඇ) දේශීය තේ අලෙවි අංශය

සමාලෝචිත වර්ෂයේ දේශීය තේ අලෙවි අංශයේ රු.9,286,555 ක තේ ඵලෙවියක් ඇත්කර ගැනීමට ක්‍රියාකාරී සැලැස්ම අනුව සැලසුම් කර තිබුණද තථ්‍ය අලෙවිය රු.3,713,253 ක් වූ අතර එය ඉලක්කගත ප්‍රමාණයෙන් සියයට 40 ක් පමණක් විය.

(ඉ) පොහොර අංශය

සමාලෝචිත වර්ෂයේ ඉලක්කගත පොහොර අලෙවිය මෙට්‍රික් ටොන් 3,827 ක් වූ අතර තථ්‍ය ඵලෙවිය මෙට්‍රික් ටොන් 679 ක් එනම් සියයට 17 ක් පමණක් විය. එසේ වුවද පසුගිය වර්ෂයේ ඉලක්කගත පොහොර අලෙවිය මෙට්‍රික් ටොන් 8,525 ක්ව තිබියදී ඉන් සියයට 16.89 ක් එනම් මෙට්‍රික් ටොන් 1,440 ක ඵලෙවිය සපුරා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ ඉලක්ක ස්ථාපනයේ දී මෙන්ම ප්‍රගතියද පසුබැමකට ලක්වී තිබුණි.

(ඊ) සුභසාධන අංශය

තේ ශක්ති අරමුදලේ කුඩා තේ වතු සමිති සාමාජිකයන්ගේ සුභසාධන අරමුදලින් තේ ශක්ති කම්හල්වල පවතින මූල්‍ය අවශ්‍යතා සපුරාගැනීම සඳහා 2000 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයේදී රු. 118,300,000 ක ණය මුදලක් කම්හල්වලට ලබාදී තිබුණද කම්හල් විසින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම ණය මුදල් පියවා නොතිබුණි. මෙම ණය මුදල සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුල අපේක්ෂිත පොලී ආදායම රු.16,244,777 ක් වුවත් කම්හල් අංශය අබණ්ඩව දලාහ ලැබීම හේතුවෙන් ණය මුදල හා පොලී ලබා ගැනීමේ අවිනිශ්චිතතාවයක් පැවතුණි.

(උ) 2015 දෙසැම්බර් 31 දිනට කොටස් හිමියන් 94,425 දෙනෙකු සතුව රු. 206,014,150 ක් වටිනා කොටස් ප්‍රමාණයක් විය. මෙම කොටස් හිමියන් සඳහා 2007 වර්ෂයෙන් පසුව සමාලෝචිත වර්ෂය දක්වා ප්‍රතිලාභ ගෙවීමට හැකිවනු පිණිස අරමුදල මෙහෙයවා නොතිබුණි. සාමාජික කොටස් හිමියන්ගේ කොටස් ප්‍රාග්ධන වටිනාකම් ඉහළ දැමීම මගින් කුඩා තේ වතු හිමියන්ගේ ආර්ථික සමාජ

පැවැත්මේ අභිවර්ධනයට කැපවූ විශිෂ්ටතම ආයතනය බවට පත්වීම ආයතනයේ දැක්ම වූවත් ඉහත සඳහන් කරුණු අනුව එම අරමුණ ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

කළමනාකරණයේ දුර්වල අධීක්ෂණයක් පැවතීම හේතුවෙන් බලංගොඩ කම්හල වසා දැමීමෙන් පසු ඉඩම් කොටස් රකට අදාල පර්චස් 18.59ක බිම් ප්‍රමාණයක් බාහිර පාර්ශවයක් විසින් අත්පත් කරගෙන තිබූ අතර මේ සම්බන්ධයෙන් බලංගොඩ දිසා අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පැවතුණි.

4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මාවරල තේ කම්හලට පයත් අක්කර 97 ක් වූ ඉඩමෙන් අක්කර 47 ක් පමණ තේ වගා කිරීමෙන් තොරව හා එම කම්හලට අයත් රු.240,000 ක් වටිනා කුඹුරු ඉඩමක් වගා කිරීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ආ) අරමුදලට අයත් පොහොර ගබඩා පරිශ්‍රයේ පොහොර මිශ්‍ර කිරීම සඳහා 2006 වර්ෂයේදී රු. 2,197,447 ක් වූ පොහොර මිශ්‍රණ යන්ත්‍රයක් මිලදීගෙන තිබූ නමුත් මිශ්‍ර කිරීමේ ව්‍යදම හා ඒ සඳහා ගතවන කාලය ඉහළ මට්ටමක පැවතීම නිසා එම යන්ත්‍රය භාවිතයට ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) බලංගොඩ කම්හල වසා දැමීමෙන් පසු ගොඩනැගිලි නිසි පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් කම්හලට අයත් නිල නිවාසය හා වැසිකිළි පද්ධතිය විනාශවෙමින් තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට වටිනාකම රු.1,350,000 ක් වූ බලංගොඩ කම්හල පිහිටි ඉඩම හා වටිනාකම රු.10,000,000 ක් වූ ගොඩනැගිලි කිසිදු ප්‍රයෝජනයක් නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) අරමුදලේ ප්‍රධාන කාර්යාලය හා සියලුම කම්හල් ඒකාබද්ධව ගිණුම් සැකසීම් සඳහා වටිනාකම රු.2,435,000 ක් වූ පරිගණක මෘදුකාංග පද්ධතියක් 2010 වර්ෂයේදී මිලදී ගෙන තිබුණද,

ගිණුම් සැකසීමේ කටයුතු සඳහා 2016 දෙසැම්බර් 20 දින වන විටත් එය භාවිතා කර නොතිබුණි.

4.4 හානි හා පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වලහන්දුව තේ කම්හලේ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම සඳහා 2013 වර්ෂයේදී උපාංග මිලදී ගැනීමට රු.2,105,980 ක් හා අළුත්වැඩියා කාර්යය සඳහා රු.438,819 ක් වැය කර තිබුණද වාර්තාවේ දිනය වන විටත් අදාල අළුත්වැඩියා කටයුතු නිමකර වියලන යන්ත්‍රය ක්‍රියාකාරී තත්ත්වයට පත්කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා තේ මණ්ඩල වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේ දැරනියගල තේ කර්මාන්ත ශාලාවේ රු.3,242,743 ක් වටිනා තේ කිලෝග්‍රෑම් 7,247 ක් මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බැවින් විනාශකර තිබුණි.

(ඇ) ඇල්පිටිය හා දෙනියාය තේ කර්මාන්ත ශාලාවන්හි පිළිවෙලින් රු. 1,669,613 ක් හා රු.1,258,758 ක් වටිනා තේ තොග හිඟය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගෙන් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.5 විකිමත් පරිදි පවරා නොගත් ඉඩම් සහ ගොඩනැගිලි

කම්හල් ගොඩනැගිලි වටිනාකම් රු.81,655,360 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණද එම ගොඩනැගිලි පිහිටි ඉඩම්වල අයිතිය පවරා ගැනීමට අරමුදල විසින් වාර්තාවේ දින දක්වා කටයුතු කර නොතිබුණි.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලේ අනුමත කාර්ය මණ්ඩලය 90 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 47 ක් වීමෙන් පුරප්පාඩු 43 ක් වූ අතර ඒ තුළ මාණ්ඩලික නිලධාරීන් 20 ක් විය. අනුමත කම්හල් කාර්ය මණ්ඩලය 199 ක් හා තථ්‍ය කම්හල් කාර්ය මණ්ඩලය 77 ක් වීමෙන් පුරප්පාඩු 122 ක් වූ අතර ඒ තුළ තාක්ෂණ නිලධාරීන් 19 ක එනම් සියයට 53 ක පුරප්පාඩු පැවතුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 2 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයෙහි 6.5.1 ඡේදය පරිදි මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනයට ඉදිරිපත් කළයුතු. වුවත් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන දින 233 ක ප්‍රමාදයකින් පසුව 2016 ඔක්තෝබර් 19 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. තවද කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2016 දෙසැම්බර් 20 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.2 අභ්‍යන්තර විගණනය

අරමුදලේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිතව තිබුණ ද එම අංශය සඳහා නිලධාරීන් දෙදෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි.

5.3 අයවැය පාලනය

අරමුදලේ අයවැය ලේඛනයට අනුව අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සියයට 22 සිට සියයට 100 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බවට නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු වේ.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) ගිණුම්කරණය	ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් පැවතීම.
(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ	දීර්ඝ කාලීනව අයකර ගැනීමට හා නිරවුල් නොකර පවතින ශේෂ පැවතීම.
(ඇ) අයවැය පාලනය	අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකියයුතු විචලනයන් නිරීක්ෂණය වීම.
(ඈ) මූල්‍ය පාලනය	බැංකු අයිරා පහසුකම් ලබාගෙන තිබීම.
(ඉ) කර්මාන්තශාලා මෙහෙයුම් පාලනය	සියළුම කර්මාන්තශාලා පාඩු ලැබීම
(ඊ) වත්කම් උපයෝජනය	නිෂ්කාර්ය වත්කම් පැවැතීම.

එච්.එම්.ගාමිණී වීරසේකර
විගණකාධිපති